# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,230 - 2021 මැයි මස 28 වැනි සිකුරාදා - 2021.05.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 1226 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1231 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2021 ජුනි මස 18 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 ජුනි මස 04 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


1223- B 82234 — 5,403 (2021/05)

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. **සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. **ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. **සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. **යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. **රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. **සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. **බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## ජාතික සමාජ සංවර්ධන ආයතනය

(සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය)

**01. තනතුර : කථිකාචාර්ය II - තනතුරු 08**

01. *වයස් සීමාව.-* අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 22ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදල නොවේ.)

02. *අධ්‍යාපන සුදුසුකම්.-* බාහිර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් වසර 04ක සමාජ වැඩ පිළිබඳ උපාධිය/සාමාජීය විද්‍යාවන්ගෙන් ලබාගත් විශේෂ ශාස්ත්‍රවේදී උපාධියක් ලබා තිබීම.

2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සමාජ වැඩ/සාමාජීය විද්‍යාවන් සහිත ශාස්ත්‍රවේදී උපාධියක් සමග අදළ විෂය ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම.

*අභ්‍යන්තර අයදුම්කරුවන්* :

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

03. *සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ක්‍රමය* :

| | *නිර්ණායකය* | *ලකුණු* |
|---|---|---|
| 1 | අධ්‍යාපන සුදුසුකම් (මූලික සුදුසුකම්වලට අතිරේකව) | 30 |
| 2 | ඉගැන්වීම් පළපුරුද්ද | 10 |
| 3 | පර්යේෂණ හා ප්‍රකාශන | 20 |
| 4 | විෂය බාහිර ක්‍රියාකාරකම් | 10 |
| 5 | පෞරුෂය | 15 |
| 6 | අදල ක්ෂේත්‍රය පිළිබඳ සාමාන්‍ය දැනුම | 15 |
| | එකතුව | 100 |

04. *වැටුප් පරිමාණය.-* AR-1 (රු. 53,150 - 10 x 1,375 - 15 x 1,910 - රු. 95,550)

**02. තනතුර : පුහුණු නිලධාරි II - තනතුරු 02**

01. *වයස් සීමාව.-* අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 22ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදල නොවේ.)

02. *අධ්‍යාපන සුදුසුකම්.-* බාහිර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සාමාජීය විද්‍යාවන්ගෙන් විශේෂවේදී උපාධියක් ලබා තිබීම.

2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සාමාජීය විද්‍යාවන්ගෙන් ලබාගත් ප්‍රථම උපාධිය සමග අදළ විෂය ක්ෂේත්‍රයෙන් පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම.

*අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)* :

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

2. ආශ්‍රිත නිලධාරීන් (MA3) සේවා ශ්‍රේණියෙහි පර්යේෂණ සහකාර/ වැඩසටහන් සහකාර (ස්ථානභාර) තනතුරක අවම වශයෙන් වසර 10ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණකර තිබීම.

03. *සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ක්‍රමය* :

| | *නිර්ණායකය* | *ලකුණු* |
|---|---|---|
| 1 | අධ්‍යාපන සුදුසුකම් (මූලික සුදුසුකම්වලට අතිරේකව) | 30 |
| 2 | පුහුණු පළපුරුද්ද | 10 |
| 3 | පර්යේෂණ, පේටන්ට් බලපත්‍ර සහ ප්‍රදනයන් | 20 |
| 4 | විෂය බාහිර ක්‍රියාකාරකම් | 10 |
| 5 | පෞරුෂය | 15 |
| 6 | අදල ක්ෂේත්‍රය පිළිබඳ සාමාන්‍ය දැනුම | 15 |
| | එකතුව | 100 |

04. *වැටුප් පරිමාණය.-* AR-1 (රු. 53,150 - 10 x 1,375 - 15 x 1,910 - රු. 95,550)

**03. තනතුර : පර්යේෂණ නිලධාරි II - තනතුරු 04**

01. *වයස් සීමාව.-* අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 22ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදල නොවේ.)

02. *අධ්‍යාපන සුදුසුකම්.-* බාහිර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සාමාජීය විද්‍යාවන්ගෙන් ලබාගත් විශේෂවේදී උපාධිය.

2. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සාමාජීය විද්‍යාවන්ගෙන් ලබාගත් ප්‍රථම උපාධිය සමග අදාල විෂයය ක්ෂේත්‍රයෙන් පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම.

*අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)* :

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. ජාතික සමාජ සංවර්ධන ආයතනයේ ආශ්‍රිත නිලධාරීන් (MA3) සේවා ගණයේ පර්යේෂණ සහකාර තනතුරක අවම වශයෙන් වසර 10ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

03. *සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ක්‍රමය* :

| | *නිර්ණායකය* | *ලකුණු* |
|---|---|---|
| 1 | අධ්‍යාපන සුදුසුකම් (මූලික සුදුසුකම්වලට අතිරේකව) | 30 |
| 2 | පර්යේෂණ පළපුරුද්ද | 10 |
| 3 | ප්‍රකාශන, පේටන්ට් බලපත්‍ර සහ ප්‍රදනයන් | 20 |
| 4 | විෂය බාහිර ක්‍රියාකාරකම් | 10 |
| 5 | පෞරුෂය | 15 |
| 6 | අදල ක්ෂේත්‍රය පිළිබඳ සාමාන්‍ය දැනුම | 15 |
| | එකතුව | 100 |

04. *වැටුප් පරිමාණය.-* AR-1 (රු. 53,150 - 10 x 1,375 - 15 x 1,910 - රු. 95,550)

**04. තනතුර : ගණකාධිකාරි - තනතුරු 01.**

01. *වයස් සීමාව.-* අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 22ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදල නොවේ.)

02. *අධ්‍යාපන සුදුසුකම්.-* බාහිර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)

1. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ගණකාධිකරණය/වාණිජ/ව්‍යාපාර කළමනාකරණය/කළමනාකරණය උපාධියක් ලබා තිබීම සහ උපාධිය ලබා ගැනීමෙන් පසු තනතුරට අදල විෂයය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 01ක පළපුරුද්දක් ලබා තිබීම.
2. පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත්වීම සහ එම සුදුසුකම් ලබා ගැනීමෙන් පසු ගණකාධිකරණය/විගණනය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 01ක පළපුරුද්දක් ලබා තිබීම.

*අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)*

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. ''කණිෂ්ඨ කළමනාකාර'' JM සේවා ගණයෙහි අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05)ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

03. *සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ක්‍රමය* :

| | | |
|---|---|---|
| අදාළ අතිරේක පළපුරුද්ද | ලකුණු | 30 |
| අදාළ අතිරේක අධ්‍යාපන සුදුසුකම් | ලකුණු | 30 |
| අනෙකුත් කුසලතා/කාර්යය සාධනය | ලකුණු | 15 |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාව | ලකුණු | 25 |
| මුළු ලකුණු ගණන | | 100 |

04. *වැටුප් පරිමාණය.-* MM 1-1 (රු. 53,175 - 10x 1,375 -15 x1,910 - රු. 95,575)

**05. තනතුර : භාෂා පරිවර්තක (සිංහල/ඉංග්‍රීසි) - තනතුරු 01**

01. *වයස් සීමාව.-* අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 22ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.)

02. *අධ්‍යාපන සුදුසුකම්.-* බාහිර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ශාස්ත්‍රවේදී ඉංග්‍රීසි භාෂා පරිවර්තක උපාධිය ලබා තිබීම.
2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ශාස්ත්‍රවේදී ඉංග්‍රීසි පිළිබඳ උපාධිය ලබා තිබීම.

*අභ්‍යන්තර අයදුම්කරුවන්* :

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

03. *සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ක්‍රමය* :

| | | |
|---|---|---|
| අදාළ අතිරේක පළපුරුද්ද | ලකුණු | 30 |
| අදාළ අතිරේක සුදුසුකම් | ලකුණු | 30 |
| වෙනත් කාර්යය සාධනයන්/කුසලතා | ලකුණු | 15 |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාව | ලකුණු | 25 |
| මුළු ලකුණු ගණන | | 100 |

04. *වැටුප් පරිමාණය.-* MA-4 (රු. 37,970 - 10 x 755 - 15 x 930-5x1,135 - රු. 65,145)

**06. තනතුර : ඉංග්‍රීසි උපදේශක - තනතුරු 02**

01. *වයස් සීමාව.-* අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 22ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදළ නොවේ.)

02. *අධ්‍යාපන සුදුසුකම්.-* බාහිර අයදුම්කරුවන් (1 හෝ 2 හෝ 3)

1. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ඉංග්‍රීසි ඉගැන්වීම් පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය/ඉංග්‍රීසි පිළිබඳ උපාධිය ;

*හෝ*

2. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) හය (06) මට්ටමට නොඅඩු මට්ටමක ඉංග්‍රීසි ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

*සහ*

සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක හෝ ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් අදාල ක්ෂේත්‍රයේ වසර පහ (05)ක පළපුරුද්දක් ලබා තිබීම.

3. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (05) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

*සහ*

සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක හෝ ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර දහය (10)ක පළපුරුද්දක් ලබා තිබීම.

*අභ්‍යන්තර අයදුම්කරුවන් :*

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

03. *සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ක්‍රමය :*

| | | |
|---|---|---|
| අදාළ අතිරේක පළපුරුද්ද | ලකුණු | 30 |
| අදාළ අතිරේක සුදුසුකම් | ලකුණු | 30 |
| වෙනත් කාර්ය සාධනයන්/කුසලතා | ලකුණු | 15 |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාව | ලකුණු | 25 |
| මුළු ලකුණු ගණන | | 100 |

04. *වැටුප් පරිමාණය.-* MA 4 (රු. 37,970 - 10 x 755 - 15 x 930-5x1,135 - රු. 65,145)

**07. තනතුර : පර්යේෂණ සහකාර - තනතුරු 03**

01. *වයස් සීමාව.-* අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 22ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.)

02. *අධ්‍යාපන සුදුසුකම් :* බාහිර අයදුම්කරුවන්

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සමාජීය විද්‍යාව/සංඛ්‍යානය විද්‍යාවන්ගෙන් ලබාගත් උපාධියක්.

*අභ්‍යන්තර අයදුම්කරුවන්*

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

03. *සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ක්‍රමය :*

| | | |
|---|---|---|
| අදළ පළපුරුද්ද | ලකුණු | 30 |
| අදළ අතිරේක සුදුසුකම් | ලකුණු | 30 |
| වෙනත් කාර්යය සාධනයන්/කුසලතා | ලකුණු | 15 |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාව | ලකුණු | 25 |
| මුළු ලකුණු ගණන | | 100 |

04. *වැටුප් පරිමාණය.-* MA 3 (රු. 32,200 - 10 x 445 - 11 x 660-10x 730 - 5 x 750 - රු. 54,960)

**08. තනතුර : වැඩසටහන් සහකාර (ස්ථානභාර) - තනතුරු 01 (හම්බන්තොට, රන්න ප්‍රාදේශීය මධ්‍යස්ථානය සඳහා)**

01. *වයස් සීමාව.-* අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 22ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.)

02. *අධ්‍යාපන සුදුසුකම් :* බාහිර අයදුම්කරුවන්

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සමාජ වැඩ/මානව සම්පත් කළමනාකරණය/රාජ්‍ය පරිපාලනය/රාජ්‍ය කළමනාකරණය/සමාජීය විද්‍යාව යන ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම.

*අභ්‍යන්තර අයදුම්කරුවන්*

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

03. *සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ක්‍රමය* :

| | | |
|---|---|---|
| අදාළ පළපුරුද්ද | ලකුණු | 30 |
| අදාළ අතිරේක සුදුසුකම් | ලකුණු | 30 |
| වෙනත් කාර්යය සාධනයන්/කුසලතා | ලකුණු | 15 |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාව | ලකුණු | 25 |
| මුළු ලකුණු ගණන | | 100 |

04. *වැටුප් පරිමාණය.*- MA-3 (රු. 32,200 - 10 x 445 - 11 x 660-10 x 730 - 5 x 750 - රු. 54,960)

**09. තනතුර : සහකාර පුස්තකාලයාධිපති - තනතුරු 01**

01. *වයස් සීමාව.*- අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 22ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදල නොවේ.)

02. *අධ්‍යාපන සුදුසුකම්* : බාහිර අයදුම්කරුවන්

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් පුස්තකාල විඥාපන උපාධිය ලබා තිබීම.

*අභ්‍යන්තර අයදුම්කරුවන්*

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

03. *සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ක්‍රමය* :

| | | |
|---|---|---|
| අදාළ පළපුරුද්ද | ලකුණු | 30 |
| අදාළ අතිරේක සුදුසුකම් | ලකුණු | 30 |
| වෙනත් කාර්යය සාධනයන්/කුසලතා | ලකුණු | 15 |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාව | ලකුණු | 25 |
| මුළු ලකුණු ගණන | | 100 |

04. *වැටුප් පරිමාණය.*- MA-3 (රු. 32,200 - 10 x 445 - 11 x 660-10 x 730 - 5 x 750 - රු. 54,960)

**10. තනතුර : පරිපාලන නිලධාරි - තනතුරු 01**

01. *වයස් සීමාව.*- අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 22ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.)

02. *අධ්‍යාපන සුදුසුකම්* : බාහිර අයදුම්කරුවන්

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මානව සම්පත් කළමනාකරණය/වාණිජ /රාජ්‍ය පරිපාලනය/රාජ්‍ය කළමනාකරණය/කළමනාකරණය උපාධියක් ලබා තිබීම.

*අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)*

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

2. ''කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන'' (MA I) සේවා ගණයෙහි II වැනි ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05)ක සතුටුදයක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

03. *සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ක්‍රමය* :

| | | |
|---|---|---|
| අදාළ අතිරේක පළපුරුද්ද | ලකුණු | 30 |
| අදාළ අතිරේක සුදුසුකම් | ලකුණු | 30 |
| වෙනත් කුසලතා කාර්යය සාධනයන් | ලකුණු | 15 |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාව | ලකුණු | 25 |
| මුළු ලකුණු ගණන | | 100 |

04. *වැටුප් පරිමාණය.*- JM 1-1 (රු. 42,600 - 10 x 755 - 18 x 1,135 - රු. 70,580)

**11. තනතුර : සහකාර ලේඛකාධිකාරී - තනතුරු 01**

01. *වයස් සීමාව.*- අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 22ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.)

02. *අධ්‍යාපන සුදුසුකම්* : බාහිර අයදුම්කරුවන්

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මානව සම්පත් කළමනාකරණය/රාජ්‍ය පරිපාලනය/රාජ්‍ය කළමනාකරණය/කළමනාකරණය උපාධියක් ලබා තිබීම.

*අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)*

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

2. 'කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන' (MA I) සේවා ගණයෙහි II වැනි ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05)ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

03. *සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ක්‍රමය* :

| | | |
|---|---|---|
| අදාළ පළපුරුද්ද | ලකුණු | 30 |
| අදාළ අතිරේක සුදුසුකම් | ලකුණු | 30 |
| වෙනත් කුසලතා හා කාර්යය සාධනයන් | ලකුණු | 15 |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාව | ලකුණු | 25 |
| මුළු ලකුණු ගණන | | 100 |

04. *වැටුප් පරිමාණය*.- JM 1-1 (රු. 42,600 - 10 x 755 - 18 x 1,135 - රු. 70,580)

**12. තනතුර : ගිණුම් නිලධාරී - තනතුරු 01**

01. *වයස් සීමාව*.- අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 22ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.)

02. *අධ්‍යාපන සුදුසුකම්* : බාහිර අයදුම්කරුවන් (පහත සුදුසුකම් 1 හෝ 2)

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ගණකාධිකරණය/වාණිජ/ව්‍යාපාර කළමනාකරණය/ කළමනාකරණය උපාධියක් ලබා තිබීම.

2. තනතුරට අදළ විෂයය ක්ෂේත්‍රයක පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත්වීම.

*අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)*

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

2. 'කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන' (MA I) සේවා ගණයෙහි II වැනි ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05)ක සතුටුදයක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

03. *සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ක්‍රමය* :

| | | |
|---|---|---|
| අදාළ පළපුරුද්ද | ලකුණු | 30 |
| අදාළ අතිරේක සුදුසුකම් | ලකුණු | 30 |
| වෙනත් කුසලතා හා කාර්යය සාධනයන් | ලකුණු | 15 |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාව | ලකුණු | 25 |
| මුළු ලකුණු ගණන | | 100 |

04. *වැටුප් පරිමාණය*.- JM 1-1 (රු. 42,600 - 10 x 755 - 18 x 1,135 - රු. 70,580)

*සියළුම තනතුරු සඳහා සේවා නියුක්ත කරවීමේ කොන්දේසි* :

1. තනතුරු ස්ථිරය.
2. රජයේ අනුමත ප්‍රතිශතයන්ට අනුව සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.
3. තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ.
4. 2019.09.12 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළකරන ලද තනතුරු පුරප්පාඩු සඳහා ඉල්ලුම්පත් ඉදිරිපත් කළ අපේක්ෂකයින් ද නැවත අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

*සටහන*.- මෙම තනතුර පුරප්පාඩුව පවතින්නේ සීදූව ප්‍රධාන කාර්යාලයේ වන අතර තෝරාගන්නා අය ප්‍රධාන කාර්යාලයේ සේවය කළ යුතුය.

*සේවා කොන්දේසි*.- 1992 අංක 41 දරන ජාතික සමාජ සංවර්ධන ආයතන පනතේ විධිවිධානවලට හා රජය විසින් වරින්වර පනවනු ලබන නීති රීති හා රෙගුලාසිවලට යටත් විය යුතුය.

*බඳවා ගැනීමේ ක්‍රමවේදය*.- පත්වීම් බලධාරියා විසින් නියම කරනු ලබන පරිදි සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ. ඉහලම ලකුණු ලැබූවන් අතරින් කුසලතා අනුපිළිවෙල අනුව තෝරා ගැනීම සිදු කෙරේ.

අයදුම්කරුවන් සම්පූර්ණ ජීවදත්ත තොරතුරු ඇතුලත් අයදුම්පත් පහත ලිපිනයට 2021.06.30 දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම් කරන තනතුර ලිපිකවරයේ වම්පස ඉහළ කෙලවරේ සඳහන් කළ යුතුය. අසම්පූර්ණ අපහැදිලි හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. රාජ්‍ය අංශයේ සේවයේ නියුතු නිලධාරීන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

එම්. ටී. ආර්. ෂාමිණී අත්තනායක,
අධ්‍යක්ෂ ජනරාල් (*වැ. බ.*),
ජාතික සමාජ සංවර්ධන ආයතනය.

2021 මැයි මස 13 වැනි දින,
අධ්‍යක්ෂ ජනරාල් (වැ. බ.),
ජාතික සමාජ සංවර්ධන ආයතනය,
ලියනගේමුල්ල,
සීදූව.

05-465

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## සෞඛ්‍ය අමාත්‍යාංශය

### අතුරු වෛද්‍ය සේවාවට අයත් දන්ත කාර්මික ශිල්පී තනතුරේ පුහුණුව සඳහා අභ්‍යාසලාභීන් බඳවා ගැනීම - 2021

01. සෞඛ්‍ය අමාත්‍යාංශයේ අතුරු වෛද්‍ය සේවාවට අයත් දන්ත කාර්මික ශිල්පී තනතුරට අදාළව පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දන්ත වෛද්‍ය පීඨය/සෞඛ්‍ය අමාත්‍යාංශයේ මහරගම මුඛ සෞඛ්‍ය ආයතනය මගින් පවත්වනු ලබන දන්ත කාර්මික ශිල්පී පාඨමාලාවට අභ්‍යාසලාභීන් බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලබා ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

2020.10.29 දිනැති අංක 2200 *ගැසට්* නිවේදනය සහ 2020.11.06 දිනැති අංක 2201 සංශෝධිත *ගැසට්* නිවේදනය අනුව 2019 වර්ෂය සඳහා පරිපූරක හා අතුරු වෛද්‍ය සේවාවට අයත් තනතුරු 12 පුහුණුවට බඳවා ගැනීම පිණිස 2021.02.21 දින දක්වා විද්‍යුත් මාධ්‍යයෙන් කැඳවන ලද අයදුම්පත් අතරින් පාඨමාලා අංක 12 යටතේ දන්ත කාර්මික ශිල්පී පුහුණුවට ඉදිරිපත් කරන ලද සියලුම අයදුම්පත් අවලංගු කර ඇත. එබැවින් ඉහත කී *ගැසට්* නිවේදනය අනුව දන්ත කාර්මික ශිල්පී පාඨමාලාවට අයදුම්පත් ඉදිරිපත් කරන ලද අයදුම්කරුවන් ද මෙම *ගැසට්* නිවේදනය අනුව අයදුම්පත් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

| *සංකේත අංකය* | *පුහුණු පාඨමාලාවේ නම* | *පුහුණු කාලසීමාව* | *පුහුණු පාඨමාලාව හැදෑරිය යුතු භාෂා මාධ්‍යය* |
|---|---|---|---|
| 1. | දන්ත කාර්මික ශිල්පී | වසර 02 | ඉංග්‍රීසි |

02. මෙම පාඨමාලාව සඳහා බඳවා ගනු ලබන අභ්‍යාසලාභීන් සංඛ්‍යාව 20 - 25 කි.

03. පුහුණු පාඨමාලාවට පළාත් වලින් බඳවා ගත හැකි අභ්‍යාසලාභීන් සංඛ්‍යාව එම පළාතේ පවතින රෝගීය අමාත්‍යාංශයට හා පළාත් සභාවට අයත් රෝහල් හා ආයතනවල පවතින පුරප්පාඩු සංඛ්‍යාව පදනම් කර ගනිමින් පළාත් පදනම මත සුදුස්සන් තෝරාගනු ලැබේ.

04. මෙම පාඨමාලාව පූර්ණකාලීන පාඨමාලාවක් වේ. එබැවින්, සතියේ දින පහේ සහ සෙනසුරාදා පෙරවරුවේ විශ්වවිද්‍යාලයක හෝ සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ හෝ වෙනත් රජයේ ආයතනයක හෝ වෙනත් කුමන හෝ පූර්ණකාලීන පාඨමාලාවන් හදාරන සිසුන් මේ සඳහා අයදුම් නොකළ යුතුය. යමෙකු එසේ අයදුම් කර පසු අවස්ථාවකදී හෝ එය අනාවරණය වුවහොත් පාඨමාලාවෙන් / තනතුරෙන් ඉවත් කර ඒ වනතෙක් රජය විසින් ඔහු/ඇය වෙනුවෙන් දරා ඇති සියලුම වියදම් අයකර ගනු ලැබේ. විශ්වවිද්‍යාලයක හෝ වෙනත් රජයේ ආයතනයක පූර්ණකාලීන පාඨමාලාවක් හදාරන අයෙකු එසේ අයදුම් කිරීමට අදහස් කරන්නේ නම්, ඔවුන් පහත දැක්වෙන ආකාරයට ක්‍රියාකළ යුතුය.

4.1 2021.07.09 දින වන විට කිසියම් දිනක ඔබ කුමන හෝ විශ්වවිද්‍යාලයක හෝ වෙනත් රජයේ ආයතනයක පූර්ණකාලීන පාඨමාලාවක් සඳහා ලියාපදිංචිව සිටියේ නම් හෝ සිටින්නේ නම්,මෙම පුහුණු පාඨමාලාව සඳහා තේරී පත්වුවහොත් එම පාඨමාලාව සඳහා ලියාපදිංචි කරන දිනට පෙර අදාළ පුහුණුවෙහි හෝ පාඨමාලාවෙහි ලියාපදිංචිය අවලංගු කරගෙන තිබිය යුතුය. ඔබ විශ්වවිද්‍යාලයක ලියාපදිංචිව සිට දේශන සඳහා සහභාගි නොවූ හෝ සහභාගි නොවන අයෙක් වුවද ඔබ විශ්වවිද්‍යාල සිසුවෙකු ලෙස සලකනු ලබන බැවින්, එවැනි අයදුම්කරුවන් ද තම ලියාපදිංචිය උක්ත පරිදි අවලංගු කරගත යුතුය. අවශ්‍ය අවස්ථාවලදී එය සනාථ කිරීම පිණිස ප්‍රමාණවත් ලිඛිත සාධක ඔබ සතුව තිබිය යුතුය.

4.2 2021.07.09 දින වන විට ඔබ විශ්වවිද්‍යාලයක හෝ සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පැවැත්වෙන පාඨමාලාවක හෝ ලියාපදිංචි වී නොසිටි අයෙක් වුව ද යම් හෙයකින් පුහුණුව සඳහා ලියාපදිංචි කරන දින වන විට ලියාපදිංචිව සිටියේ නම් ඔහු / ඇය පුහුණුවේ ලියාපදිංචි වීමට පෙර එම පාඨමාලාවේ ලියාපදිංචිය අවලංගු කර ගත යුතුය.

4.3 ඔබ යම් විශ්වවිද්‍යාලයක උපාධියක් සම්පූර්ණ කර සිටින අයෙක් නම් එම උපාධිය බලපැවැත්වෙන දිනය (EFFECTIVE DATE) පාඨමාලාවට බඳවා ගන්නා දිනට පෙර දිනයක් විය යුතුය.

4.4 සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පූර්ණකාලීන පුහුණු පාඨමාලාවල ලියාපදිංචි වී සිටින අයදුම්කරුවන් වේ නම් ඔවුන් පුහුණුවට තේරී පත්වුවහොත් ඒ වන විට ලබමින් සිටි පුහුණුවට අදාළව අත්සන් කර තිබෙන ගිවිසුම්වලට අනුව ගිවිසුම්ගත මුදල හා ඒ වන විට ලබා ඇති සියලු දීමනාවන් ගෙවා අදාළ පුහුණුවෙන් ඉවත් වුවහොත් පමණක් පුහුණුව සඳහා ලියාපදිංචි කරනු ලැබේ.

*සැලකිය යුතුයි.*-

I. ඉහත 4.1 සිට 4.4 දක්වා සඳහන් කොන්දේසි සියල්ල සම්පූර්ණ කර තිබුණ ද අනිවාර්යයෙන්ම ඔබ මෙම පාඨමාලාව සඳහා ඇතුළත් කර ගන්නේය යන්න මෙම *ගැසට්* නිවේදනයේ කුමන හෝ වගන්තියක් මගින් අදහස් **නොකෙරෙන** බව ඔබ තරයේ සිහි තබා ගත යුතුය.

II. එම 4.1 සිට 4.4 දක්වා සඳහන් කොන්දේසි සම්පූර්ණ කර තිබුණ ද, ඔබ සුදුසුකම් ලැබීමට ප්‍රමාණවත් Z අගයක් ලබා නොමැති නම් හෝ මෙහි සඳහන් අනෙකුත් කුමන හෝ කොන්දේසියක් සම්පූර්ණ කර නොමැති නම් කිසිඳු අයුරකින් මෙම පාඨමාලාව සඳහා සුදුසුකම් නොලබන බව ඔබ දැනගත යුතුය.

II. එමෙන්ම, ඔබ ප්‍රමාණවත් Z අගයක් ලබා මෙහි සඳහන් අනෙකුත් කොන්දේසි සියල්ල සම්පූර්ණ කර තිබුණ ද, 4.1 සිට 4.4 දක්වා සඳහන් කොන්දේසි සම්පූර්ණ කර නොමැති නම්, කිසිඳු අයුරකින් මෙම පාඨමාලාව සඳහා සුදුසුකම් නොලබන බව ඔබ තවදුරටත් දැනගත යුතුය.

05. තනතුරට අදාළ අධ්‍යාපන හා වෙනත් විශේෂ සුදුසුකම්

| *පුහුණු පාඨමාලාව* | *අ.පො.ස.(සා.පෙළ) සුදුසුකම්* | *අ.පො.ස.(උ.පෙළ) සුදුසුකම්* | *පුහුණු පාඨමාලාවට අදාළ වෙනත් විශේෂ සුදුසුකම්* |
|---|---|---|---|
| දන්ත කාර්මික ශිල්පී | සිංහල/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සමාර්ථයක් සහිතව ඉංග්‍රීසි භාෂාව ද ඇතුළුව විෂයන් 06 කින් දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම. | 2017 සහ 2018 වර්ෂයේදී අ.පො.ස. (උ.පෙළ) විභාග යෙන් විද්‍යා විෂය ධාරාවෙන් **රසායන විද්‍යාව** විෂයට සම්මාන සාමාර්ථයක් සහිතව භෞතික විද්‍යාව, ජීව විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයයන් අතුරින් දෙකක් (02) එක්වරකදී සමත්වීම | නැත |

06. *අනෙකුත් පොදු සුදුසුකම්* :

(*අ*) ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

(*ආ*) අයදුම්කරුවන් අයදුම්පත් කැඳවන අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ වයස අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.

(*ඇ*) පුහුණුවෙන් පසු මධ්‍යම රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ අවම වශයෙන් වසර 10 ක් වත් සේවය කිරීමට කැමති විය යුතුය.

(*ඈ*) මනා ශාරීරික හා මානසික සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.

(*ඊ*) තමන් අයදුම් කරන දිස්ත්‍රික්කය තුළ අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පූර්වාසන්න වසර 03 ක් අඛණ්ඩව පදිංචිව සිටිය යුතුය. (ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කල හෝ ග්‍රාම සේවක විසින් අත්සන් කල DS 4 සහතිකය ඉදිරිපත් කල යුතුය.)

07. *අයදුම් කළ යුතු ක්‍රමය* :

(*අ*) මේ සමඟ ඇති ආකෘති පත්‍රය අනුව අයදුම්පත සකස් කර ගත යුතුය. ඒ සඳහා A4 ප්‍රමාණයේ කඩදාසි භාවිත කළ යුතුය. අයදුම්පතෙහි 1 සිට 9(අ) දක්වා පළමු පිටුවේ ද, 9 (ආ) සිට 12 දක්වා දෙවන පිටුවේ ද වන පරිදි සකස් කල යුතුය.

(ආ) අයදුම්පතෙහි "ලදුපත"යන ස්ථානයේ ලංකා බැංකුව තැපොබේන් ශාඛාවේ අංක 7041318 දරන සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් - විභාග ගාස්තු රැස් කිරීම යන ගිණුමට රුපියල් 300/- ක මුදල බැර කර එම ලදුපත නොගැලවෙන සේ ඇලවිය යුතුය. ලදුපත ඇලවීමට ප්‍රථම එහි පිටපතක් තබා ගන්න.

(ඇ) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියෙකු/ අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරියෙකු/ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධාරියෙකු/රජයේ විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු/නීතිඥවරයෙකු හෝ වර්ෂයකට රු. 512,148/-කට නොඅඩු වැටුපක් ලබන ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන රජයේ නිලධාරියෙකු විසින් අයදුම්කරුගේ /අයදුම්කාරියගේ අත්සන සහතික කල යුතුය.

(ඈ) නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත සමග අදාළ ආකෘති පත්‍රය අමුණා එම කවරයෙහි ඉහළ වම් කෙළවරේ ''අතුරු වෛද්‍ය සේවාවේ දන්ත කාර්මික පුහුණුව සඳහා අභ්‍යාසලාභීන් බඳවා ගැනීම 2021 '' යනුවෙන් සඳහන් කර, ඊට පහළින් ඔබ ඉල්ලුම් කරන පළාත හා දිස්ත්‍රික්කය සඳහන් කොට 2021.07.09 දිනට පෙර අධ්‍යක්ෂ, පරිපාලන - ආයතනික ශාඛාව, නො 26, මෙඩි හවුස් ගොඩනැගිල්ල, 4 වන මහල, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10 වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

08. අයදුම්පත් ලැබුණු බව දන්වා එවනු නොලැබේ.

09. අසම්පූර්ණ, ආදර්ශ ආකෘති පත්‍රයට අනුකූල නොවන, මූලික සුදුසුකම් සම්පූර්ණ කර නොමැති, බැංකු ලදුපත අලවා නොමැති හා 2021.07.09 වැනි දින හෝ ඊට පෙර ලියාපදිංචි කර නොමැති අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

10. ඉහත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් /අයදුම්කාරියන් අතුරින් Z අගය අනුව සකස් කරනු ලබන ප්‍රමුඛතා ලේඛනයක් පදනම් කරගෙන තෝරාගත් පිරිසක් පමණක් සෞඛ්‍ය අමාත්‍යාංශයේ මාණ්ඩලික නිලධාරීන් හා වෙනත් අමාත්‍යාංශයක මාණ්ඩලික නිලධාරියෙකුගේ නියෝජනයෙන් යුතු සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.සම්මුඛ පරීක්ෂණයේ දී අයදුම්කරුවන් /අයදුම්කාරියන් විසින් පහත සඳහන් ලියවිලිවල **මුල් පිටපත්** ඉදිරිපත් කල යුතුය.

(අ) උප්පැන්න සහතිකය ;

(ආ) අ.පො.ස. (උ.පෙළ) විභාග ප්‍රතිඵල හා Z අගය දැක්වෙන සහතිකයේ මුල් පිටපත ;
(මෙහි සහතික කළ පිටපතක් අයදුම්පත සමග ද අමුණා එවිය යුතුය.)

(ඇ) අ.පො.ස. (සා.පෙළ) විභාග ප්‍රතිඵල දැක්වෙන සහතිකයේ මුල් පිටපත ;
(මෙහි සහතික කළ පිටපතක් අයදුම්පත සමග ද අමුණා එවිය යුතුය.)

(ඈ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ රියදුරු බලපත්‍රය ;

(ඉ) ඉහත 6 (ඊ) අනුව පදිංචිය සනාථ කිරීම සඳහා ග්‍රාම නිලධාරී විසින් අත්සන් කල හෝ ප්‍රාදේශීය ලේකම් අනු අත්සනින් නිකුත් කරන ලද පදිංචිය පිළිබඳ සහතිකය.

11. සම්මුඛ පරීක්ෂණයෙන් පසු සුදුසු වූ අයදුම්කරුවන් පිළිබඳ තොරතුරු www.health.gov.lk වෙබ් අඩවියේ පළ කරනු ලැබේ.

12. *පුහුණු කිරීමේ පරිපාටිය* :-

I. සම්මුඛ පරීක්ෂණයට ලක් කරන ලද අයදුම්කරුවන් අතුරින් තෝරාගත් අයදුම්කරුවන්/ අයදුම්කාරියන් දන්ත කාර්මික පුහුණු පාඨමාලාව හැදෑරීම සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දන්ත කාර්මික පුහුණු පාසලට සහ මහරගම මුඛ සෞඛ්‍ය ආයතනයට ඇතුළත් කරනු ලැබේ. පුහුණුව ඉංග්‍රීසි මාධ්‍යයෙන් හැදෑරිය යුතුය.

II. පුහුණු පාසලට ඇතුළත් කරන අභ්‍යාසලාභීන් පුහුණු පාසැලේ බලපැවැත්වෙන නීතිරීතිවලට හා සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් කලින් කලට පනවනු ලබන වෙනත් නියෝගවලට ද යටත් වනු ඇත.

III. පුහුණුව ලබන කාලපරිච්ඡේදය තුළ නියමිත විභාග වලින් අසමත් වන හෝ වැඩ හා හැසිරීම සතුටුදායක නොවන හෝ තමන් ඇතුළත් කරනු ලබන පුහුණු පාසලෙහි විභාග හා නිවාඩුවලට අදාළ කොන්දේසි පිළිපැදීමට අපොහොසත් වන අභ්‍යාසලාභීන්ගේ පුහුණුව, ඕනෑම අවස්ථාවකදී වන්දි ගෙවීමකින් තොරව අවසන් කල හැකිය.

IV. පුහුණුව ලබන කාලපරිච්ඡේදය තුළදී අභ්‍යාසලාභීන්ට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි උපලේඛණ V හි විධිවිධාන වලට අනුව මාසික දීමනාවක් ගෙවනු ලැබේ.

V. පුහුණු පාසලට ඇතුළත් කරනු ලබන අවස්ථාවේ දී පුහුණුව සාර්ථකව නිම කරන බවටත්, පුහුණු පාඨමාලාව අත්හැර නොයන බවටත්, එකී පුහුණුව සම්පූර්ණයෙන්ම නිම කිරීමෙන් පසු අදාළ තනතුරේ පත්වීම ලදහොත් අවම වශයෙන් වර්ෂ දහයක (10) කාල පරිච්ඡේදයක් රාජ්‍ය සේවය යටතේ / පළාත් රාජ්‍ය සේවය යටතේ අදාළ තනතුරේ සේවය කරන බවටත්,සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් සමග ගිවිසුමකට හා ඇපකරයකට එළඹිය යුතුය. පුහුණු කාලසීමාව තුළදී පුහුණුවෙන් ඉවත් වුවහොත්, පුහුණුව හැරගියහොත් ඉහත III වගන්තිය අනුව පුහුණුවෙන් ඉවත් කිරීමට සිදුවුවහොත් හෝ පත්වීම් ලැබ වර්ෂ දහයක (10) කාල පරිච්ඡේදයක් දන්ත කාර්මික තනතුරේ සේවය කිරීමට අපොහොසත් වුවහොත් පුහුණු කාලය තුළදී ඔහුට / ඇයට ගෙවන ලද දීමනාව, රජය විසින් දරන ලද වියදම් හා ඇපකරයට අදාළ මුදල ඔහු / ඇය විසින් සෞඛ්‍ය අමාත්‍යාංශයට ගෙවිය යුතුය. එසේ නොමැති වුවහොත්,එම මුදල් අයකර ගැනීමට ගිවිසුම් ප්‍රකාර නීත්‍යානුකූලව කටයුතු කිරීමට පියවර ගනු ඇත.

13. *සේවයේ නියුක්ත කරවීමේ නියමයන්* :-

පුහුණුව අවසානයේ ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීමට රජය බැඳී නොසිටී. එහෙත්, තමන් පුහුණුවට බඳවා ගත් පාඨමාලාවට අදාළව බඳවා ගැනීමේ පරිපාටියේ කොන්දේසි හා පුහුණුව අවසන් කරන දිනය වන විට පවත්නා වූ පුරප්පාඩු මත සකස් කරන ප්‍රමුඛතා පුරප්පාඩු ලේඛනය සඳහා ජ්‍යෙෂ්ඨ නිලධාරීන් වෙත ස්ථාන මාරු ලබා දීමෙන් අනතුරුව ඉතිරි වන පුරප්පාඩු සඳහා පවත්නා මනාපය හා පුහුණු පාඨමාලාවේ අවසන් පරීක්ෂණ කුසලතාවය සැලකිල්ලට ගෙන අදාළ තනතුරේ III පංතියේ තනතුරකට පත් කිරීම සඳහා සලකා බලනු ලැබේ.

පුහුණුව අවසානයේ දී ස්ථිර පත්වීම් ප්‍රදානය කළහොත් MT-6, වැටුප් පරිමාණ අනුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි විධිවිධාන පරිදි රු. 32,080 - 10x445-11x660 - 10x730 - 10x750 - රු 58,590/-වැටුප් ගෙවනු ලැබේ.

14. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් පිළිබඳ විස්තර අයදුම්පත පිරවීමේදී ඉතා සැලකිලිමත්ව හා නිවැරදිව ඇතුළත් කල යුතුය. පුහුණුව සඳහා බඳවා ගැනීමෙන් හෝ පත්වීම් ලැබීමෙන් පසු යට කී සහතික ව්‍යාජ බවට ඔප්පු වුවහොත් නීත්‍යානුකූලව කටයුතු කිරීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමටත්, ඒ දෙනු ලබන පත්වීම අවලංගු කර පුහුණුවෙන්/තනතුරෙන් පහ කරන අතර, ඒ සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කර නැවත රජයේ සේවයට නොගන්නවුන්ගේ අසාධු ලේඛනයට ඔහුගේ / ඇයගේ නම ඇතුළත් කිරීමටත් කටයුතු කරනු ලැබේ. තව ද, පුහුණු කාලය තුළදී ඔහුට/ඇයට ගෙවන ලද දීමනාව රජය විසින් දරන ලද වියදම් හා ඇපකරයට අදාළ මුදල ඔහුගෙන් / ඇයගෙන් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.

15. තෝරාගත් අයදුම්කරුවන් අදාළ පාඨමාලාව හැදෑරීමට හා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කායික හා මානසික යෝග්‍යතාවයකින් හෙබි බව සනාථ කරනු පිණිස පුහුණුවේ පළමු මාසය ඇතුළත වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, වෛද්‍ය පරීක්ෂණයේ දී අයෝග්‍ය බව පෙනී යන අයදුම්කරුවන් පාඨමාලාවේ රැඳී සිටීමට නුසුදුස්සන් වනු ඇත.

16. ඉහත පරිදි බඳවා ගන්නා ලද සියලුම දෙනා රජයේ සේවයකයින්ට අදාළ වන සියලුම නීතිරීතිවලට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට, සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නියම කරනු ලබන ප්‍රතිපත්තිවලට,මුදල් රෙගුලාසි හා වෙනත් රෙගුලාසිවලට ද, රජය විසින් වරින්වර පනවනු ලබන නීතිරීති හා නියෝගයන්ට ද යටත් වනු ඇත.

17. පුහුණුවට බඳවා ගනු ලබන අයදුම්කරුවන් සඳහා පුහුණු පාසලේ නේවාසික පහසුකම් සැපයීමට මෙම අමාත්‍යාංශය බැඳී නොසිටී. එසේ ලබා දෙන්නේ නම්, ඒ සඳහා තක්සේරු කාමර කුලිය, ජල හා විදුලි බිල්පත් අය කරනු ලැබේ.

18. මෙම පුහුණු කාලසීමාව තුළදී වෘත්තීය සමිති කටයුතුවල යෙදීම හෝ පෞද්ගලික සේවයේ යෙදීමට හෝ කිසිම අයිතිවාසිකමක් නොමැත. එසේම, පුහුණුවෙන් පසුව ඔබ අදාළ තනතුරේ පත්වීම් ලදහොත්, ඉන්පසුව ද පෞද්ගලික සේවයේ යෙදීමට ඔබට කිසිඳු අයිතිවාසිකමක් නොමැත. එවැන්නක් සිදු කර අනාවරණය වුවහොත් නීත්‍යානුකූලව කටයුතු කිරීමට පියවර ගනු ලැබේ.

19. පුහුණුවට බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙම *ගැසට්* නිවේදනය මගින් ආවරණය වන හෝ නොවන යම් කරුණක් සම්බන්ධයෙන් යම් ගැටලු සහගත තත්ත්වයක් උදා වුවහොත්, ඒ පිළිබඳ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වනු ඇත.මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර යම් පරස්පරතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේය.

වෛද්‍ය එස්.එච්. මුණසිංහ,
ලේකම්,
සෞඛ්‍ය අමාත්‍යාංශය.

2021 මැයි 22 වැනි දින,
"සුවසිරිපාය ",
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ - 10.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***අතුරු වෛද්‍ය සේවාවේ පුහුණුව සඳහා දන්ත කාර්මික ශිල්පී අභ්‍යාසලාභීන් බඳවා ගැනීම - 2021***

අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර *ගැසට්* නිවේදනය හොඳින් කියවා බලන්න

1. (*අ*) මුලකුරු සමඟ අගට යෙදෙන නම : ..................................................
(ඉංග්‍රීසී කැපිටල් අකුරෙන්) - *උදා* A. B. C. SILVA

(*ආ*) සම්පූර්ණ නම (ඉංග්‍රීසී කැපිටල් අකුරෙන්) :..................................................
..................................................

(*ඇ*) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :..................................................
..................................................

2. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | | (පිටපතක් අමුණන්න)

3. තැපැල් ලිපිනය :

| සිංහලෙන්/දෙමළෙන් | ඉංග්‍රීසියෙන් |
|---|---|
| .................................... | .................................... |
| .................................... | .................................... |
| .................................... | .................................... |
| .................................... | .................................... |

4. (*අ*) ස්ථිර ලිපිනයඃ

| සිංහලෙන්/දෙමළෙන් | ඉංග්‍රීසියෙන් |
|---|---|
| .................................... | .................................... |
| .................................... | .................................... |
| .................................... | .................................... |
| .................................... | .................................... |

(*ආ*) දුරකථන අංක : - ජංගම | | | | | | | | | | | ස්ථාවර | | | | | | | | | | |

(*ඇ*) පදිංචි දිස්ත්‍රික්කය :- සිංහලෙන්/දෙමළෙන් ........................................ ඉංග්‍රීසියෙන්........................................

(*ඈ*) ඔබ මෙම දිස්ත්‍රික්කය තුළ ස්ථිර පදිංචි කරුවෙක් ද ? (ඔව්/නැත) :-........................................

(*ඉ*) "ඔව්"නම් කොපමණ කලක පටන් ද ? :-........................................

5. උපන් දිනය :- වර්ෂය...................... , මාසය......................, දිනය......................,

2021...................... දිනට වයස :- අවුරුදු ......................, මාස......................, දින......................,

උස :- අඩි...................... අඟල්......................

6. ස්ත්‍රී/ පුරුෂ භාවය :- ස්ත්‍රී - ☐ පුරුෂ - ☐ (අදාළ කොටුවේ √ ලකුණ යොදන්න)

7. ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක් ද යන වග :- ඔව් - ☐ නැත - ☐ ( අදාළ කොටුවේ √ලකුණ යොදන්න )

8. විවාහක/ අවිවාහක බව :- විවාහක - ☐ අවිවාහක - ☐

9. අධ්‍යාපන සුදුසුකම් :-

(අ) අ.පො.ස. (උ.පෙළ) විභාගය (Z අගය සහිත ප්‍රතිඵල ලේඛනයේ සහතික කළ පිටපතක් අමුණන්න)

විභාගයට ඉදිරිපත් වූ දිස්ත්‍රික්කය :-......................

විභාගයට පෙනී සිටි වර්ෂය :......................විභාග අංකය :-......................

Z අගය :...................... විෂය ධාරාව :......................

විභාගයට පෙනී සිටි මාධ්‍යය :......................

| අනු. අංකය | විෂයය | සාමාර්ථය |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |

(ආ).අ.පො.ස. (සා.පෙළ) විභාගය

| අනු. අංකය | විෂයය | පළමු වර | | දෙවන වර | |
|---|---|---|---|---|---|
| | | වර්ෂය | | වර්ෂය | |
| | | විභාග අංකය | | විභාග අංකය | |
| | | සාමාර්ථය | | සාමාර්ථය | |
| 1 | සිංහල භාෂාව / දෙමළ භාෂාව | | | | |
| 2 | ගණිතය | | | | |
| 3 | විද්‍යාව | | | | |
| 4 | ඉංග්‍රීසි | | | | |
| 5 | | | | | |
| 6 | | | | | |
| 7 | | | | | |
| 8 | | | | | |
| 9 | | | | | |
| 10 | | | | | |
| 11 | | | | | |
| 12 | | | | | |

* ඔබ විසින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සඳහා පෙනී සිටි සියලු විෂයන් ඉහත වගුවෙහි සඳහන් කළ යුතු වේ.

10. ඔබ කවරදාක හෝ කවර චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු වී තිබේ ද ? ඔව් - ☐ නැත - ☐
(අදාළ කොටුවේ √ලකුණ යොදන්න)

ඔව් නම් විස්තර සපයන්න :- ..........................................................................................................................
..........................................................................................................................

11. අයදුම්කරුගේ සහතිකය :-

(*අ*) මා විසින් *ගැසට්* නිවේදනය හොඳින් කියවා බලා අවබෝධ කරගෙන එහි සඳහන් සියලු කොන්දේසිවලට යටත්ව මෙම අයදුම්පත සම්පූර්ණ කළ බවත්, මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බවත් ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි.

(*ආ*) මා විසින් කරන ලද මෙම ප්‍රකාශය හෝ අයදුම්පතෙහි සඳහන් කර ඇති කුමන හෝ තොරතුරක් අසත්‍ය යැයි ඔප්පු වුවහොත් මා පුහුණුවට නුසුදුස්සකු වන බව හා පත්වීම් ලදහොත් ඉන් අනතුරුව හෝ එසේ ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට මා යටත් බව ද මම දැන සිටිමි.

| |
|---|
| ලංකා බැංකු තැප්‍රොබේන් ශාඛාවේ, අංක 7041318 දරන සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ විභාග ගාස්තු රැස්කිරීම යන ගිණුමට අදාළ මුදල් ගෙවා එම ලදුපතෙහි මුල් පිටපත මෙම ස්ථානයේ නොගැලැවෙන සේ අලවන්න. |

..........................................................
අයදුම්කරුගේ / අයදුම්කාරියගේ අත්සන.

දිනය :.................................

12. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන..................................මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකවම දන්නා හඳුනන බව ද, ඔහු / ඇය........................... දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද සහතික කරමි.

....................................
සහතික කරන්නාගේ අත්සන.

දිනය :- ....................................

..................................

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :-..................................................

.............................................................
සහතික කරන්නාගේ නිල මුද්‍රාව.

* තනතුර :-..................................................
* ලිපිනය :-.............................................
....................................................................

05 - 173

## ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය

### ග්‍රාම නිලධාරි III ශ්‍රේණියට බඳවා ගැනීමේ තරග විභාගය - 2020(2021)

දිවයින පුරා ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පුරප්පාඩුව පවතින ග්‍රාම නිලධාරි කොට්ඨාසවලට ග්‍රාම නිලධාරීන් පත් කිරීම සඳහා සුදුස්සන් තෝරාගැනීම පිණිස පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයට පෙනී සිටීම සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයෙන් අයදුම්පත් කැඳවනු ලබන අතර එම පරීක්ෂණය විභාග කොමසාරිස් ජනරාල් විසින් 2021 සැප්තැම්බර් මස පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. අයදුම්කරුවකුට පහත 06 වගන්තියෙහි සඳහන් විධිවිධාන අනුව සුදුසුකම් ලබන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පවත්නා පුරප්පාඩු සඳහා ඉල්ලුම් කළ හැකිය.

03. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හා අයත් දිස්ත්‍රික්ක සහ අයත් පළාත් පිළිබඳ තොරතුරු I වැනි උපලේඛනයේ දැක්වේ. අයදුම්කරුවන් තමා ඉල්ලුම් කරන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය හා එහි අංකයත්, දිස්ත්‍රික්කයේ නම හා අංකයත්, පළාතේ නම හා අංකයත් එම උපලේඛනයේ සඳහන් පරිදි නිවැරදිව අයදුම්පතේ නියමිත ස්ථානයේ සඳහන් කළ යුතුය. එය පසු අවස්ථාවක වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. එම විස්තර වැරදි ලෙස සටහන් කිරීම හේතුවෙන් අයදුම්කරුවකුට සිදුවන කිසියම් අවාසියක් සම්බන්ධ කිසිදු ඉල්ලීමක් සලකා නොබලන අතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය හා කොට්ඨාස අංකය සඳහන් කර නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. *තරග විභාගය පිළිබඳ විස්තර* :

4.1 විභාග මාධ්‍යය - මෙම විභාගය සිංහල,දෙමළ,ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යවලින් I වැනි උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික්ක තුළදී පවත්වනු ඇත. එහෙත් විභාග මධ්‍යස්ථානයක් පිහිටුවීමට ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉල්ලුම් කර නොමැති දිස්ත්‍රික්කවල අයදුම්කරුවන් ආසන්න වෙනත් දිස්ත්‍රික්කයක විභාග මධ්‍යස්ථානයක් වෙත යොමු කරනු ලැබේ. අපේක්ෂකයින් එක් භාෂා මාධ්‍යකින් පමණක් පෙනී සිටිය යුතුය. ඉල්ලුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ ලබා දෙනු නොලැබේ.

4.2 ග්‍රාම නිලධාරීන් බඳවා ගැනීමේ විභාගය, පහත සඳහන් ප්‍රශ්න පත්‍ර 02කින් සමන්විත වේ.

| *විෂයය* | *ලකුණු සංඛ්‍යාව* | *සමත් වීමට ලැබිය යුතු අවම ලකුණු සංඛ්‍යාව* | *කාලය* |
|---|---|---|---|
| 01. භාෂා හැකියාව | 100 | 40 | පැය 1 1/2 |
| 02. සාමාන්‍ය දැනීම හා අභියෝග්‍යතාව | 100 | 40 | පැය 1 1/2 |

4.3 ලිඛිත විභාගයේ විෂය නිර්දේශය :

4.3.1 භාෂා හැකියාව :

මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයන්ගේ අදහස් ප්‍රකාශනය, අවබෝධය, අක්ෂර වින්‍යාසය, භාෂාව හා රචනය, දෙන ලද ලිපියක් කෙටුම්පත් කිරීම,දී ඇති පාඨ සාරාංශ කිරීම, දී ඇති වාක්‍ය කිහිපයක අදහස තනි වාක්‍යයකින් ලිවීම සහ සරල ව්‍යාකරණ භාවිතය පිළිබඳ දැනුම පරීක්ෂා කෙරෙන විෂයානුබද්ධ ප්‍රශ්නවලින් සමන්විත වේ. සියලු ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතුය.

4.3.2 සාමාන්‍ය දැනීම හා අභියෝග්‍යතාව :

මෙම ප්‍රශ්න පත්‍රය මගින් දේශීය හා විදේශීය වශයෙන් වැදගත්වන ඓතිහාසික, භූගෝලීය, සමාජයීය හා ආර්ථික තොරතුරු හා දේශීය හා විදේශීය කාලීන තොරතුරු පිළිබඳ සාමාන්‍ය දැනීම සහ සංඛ්‍යාමය හැකියාවන්, තර්කන ශක්තිය, ගැටලු නිරාකරණය, තීරණ ගැනීමේ හැකියාව ඇතුළු සාමාන්‍ය බුද්ධිය මැනෙන අයුරින් සැකසෙන බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්නවලින් සමන්විත වේ. සියලු ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතුය.

4.4 ලිඛිත පරීක්ෂණයෙන් වැඩිම ලකුණු ලබාගැනීමේ අනුපිළිවෙළ අනුව අයදුම්කරුවන් ප්‍රමුඛතාගත කිරීමේදී එක් එක් විෂයයට 40%ක් හෝ ඊට වැඩියෙන් ලකුණු ලබා ඇති අයදුම්කරුවන් පමණක් සැලකිල්ලට ගනු ලැබේ.

05. *බඳවා ගැනීමේ ක්‍රමය :*

(i) ලිඛිත විභාගයෙන් එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් වැඩිම ලකුණු ලබා ඇති අයදුම්කරුවන් අතරින් එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක අයදුම්කරුවන් සංඛ්‍යාවක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබේ. ලිඛිත විභාගයේ සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගන්නා ලකුණුවල එකතුවෙන් වැඩිම ලකුණු ලබා සුදුසුකම් ලබන අයදුම්කරුවන් එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම සඳහා පුහුණු පාඨමාලාවකට තෝරාගනු ලැබේ.

ඒ යටතේ පහත ව්‍යතිරේකයන් ඇතුළත් වේ.

(*අ*) එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක පවතින පුරප්පාඩු ප්‍රමාණය සම්පූර්ණ කිරීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සුදුසුකම් නොලබා ඇති අවස්ථාවකදී එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය පිහිටි දිස්ත්‍රික්කයේ විභාගය සමත් අයදුම්කරුවන්ගේ දිස්ත්‍රික් කුසලතා අනුපිළිවෙළ අනුව ඉදිරි පුරප්පාඩු සංඛ්‍යාව පුරවනු ලැබේ. (මේ යටතේ බඳවා ගැනීම සඳහා *ගැසට්* නිවේදනයේ 6.1 යටතේ සඳහන් සුදුසුකමේ "ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ" යන්න "දිස්ත්‍රික්කය තුළ" ලෙස සලකනු ලැබේ.)

(*ආ*) ඉහත (අ) අනුව දිස්ත්‍රික්කයක පවතින පුරප්පාඩු ප්‍රමාණය සම්පූර්ණ කිරීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් එම දිස්ත්‍රික්කයෙන් සුදුසුකම් නොලබා ඇති අවස්ථාවකදී එම දිස්ත්‍රික්කය පිහිටි පළාතේ විභාගය සමත් අයදුම්කරුවන්ගේ කුසලතා අනුපිළිවෙළ අනුව ඉතිරි පුරප්පාඩු සංඛ්‍යාව පුරවනු ලැබේ. (මේ යටතේ බඳවා ගැනීම සඳහා *ගැසට්* නිවේදනයේ 6.1 යටතේ සඳහන් සුදුසුකමේ "ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ" යන්න "පළාත තුළ" ලෙස සලකනු ලැබේ.)

(ii) ඉහත 5 (i) ඡේදයේ සඳහන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ආකාරයට ලකුණු ලබාදෙනු ඇත.

(*අ*)

| ලකුණු දෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|
| නායකත්වය | 15 |
| ක්‍රීඩා කුසලතා | 05 |
| භාෂා ප්‍රවීණතාව (මව් භාෂාව හැර අනෙක් භාෂා ප්‍රවීණතාවන්ට) | 10 |
| පරිගණක දැනුම | 15 |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාව | 05 |
| එකතුව | 50 |

(*ආ*) ලකුණු ලබාදීමේ දී සලකා බලනු ලබන්නේ රාජ්‍ය ආයතනයකින්/දෙපාර්තමේන්තුවකින් විධිමත්ව නිකුත් කරන ලද සහතික සහ අදාළ කරුණු සනාථ කිරීම සම්බන්ධයෙන් වගකීම පැවරෙන රජයේ දෙපාර්තමේන්තු, ආයතනවල මාණ්ඩලික මට්ටමේ නිලධාරීන් නිකුත් කරන ලද සනාථ කිරීමේ ලිපි පමණි. උදාහරණ වශයෙන් දහම් පාසල් ගුරුවරයකු ලෙස කටයුතු කිරීම, ග්‍රාම සංවර්ධන සමිතියක නිලතල දැරීම, ක්‍රීඩා සමාජයක නිලතල දැරීම වැනි කරුණු ප්‍රාදේශීය ලේකම් විසින් සනාථ කළ යුතුය.

(*ඇ*) ග්‍රාම නිලධාරීන්ට දේශපාලන අයිතිවාසිකම් නොමැති බැවින් දේශපාලන මට්ටමේ සංවිධානවල නිලතල දැරීම සම්බන්ධයෙන් ලකුණු ලබාදෙනු නොලැබේ. උදාහරණ වශයෙන් ප්‍රාදේශීය සභා/නගර සභා මන්ත්‍රීවරුන්, සමුපකාර සමිති අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් වැනි දේශපාලන පක්ෂ නියෝජනයෙන් ලබා ගන්නා තනතුරු දැක්විය හැකි ය.

(iii) මාස තුනක් වන පුහුණු පාඨමාලාව දිස්ත්‍රික් ලේකම්ගේ අධීක්ෂණය යටතේ පවත්වන අතර එම පුහුණු පාඨමාලාව සාර්ථකව නිම කරන ලද බවට දිස්ත්‍රික් ලේකම් විසින් නිර්දේශ කරන අය මවිසින් ග්‍රාම නිලධාරි III වන ශ්‍රේණියට පත්කරනු ලැබේ. පුහුණු කාලය සඳහා රු.3000.00ක දීමනාවක් පමණක් ගෙවනු ලබන අතර එම කාලය තුළ නිවාඩු හිමිකම් නොමැත. පාඨමාලාව පැවැත්වෙන දින ගණනින් 80% අවම වශයෙන් සහභාගි විය යුතුය. පුහුණු වැඩසටහන යටතේ පැවැත්වෙන ලිඛිත පරීක්ෂණයෙන් සමත්වීම සඳහා 50%ක් ලකුණු ලබාගත යුතු ය. පුහුණු කාලය සේවා කාලයට ගණනය කරනු නොලබන අතර එම කාලය විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව විශ්‍රාම වැටුප් ගණනය සඳහා පමණක් අදාළ කරගනු ඇත.

(iv) පුරප්පාඩුවක් හෝ පුරප්පාඩු කිහිපයක් සඳහා සමාන ලකුණු ලබා ඇති අයදුම්කරුවන් එක් අයකුට වඩා වැඩි සංඛ්‍යාවක් ඇති අවස්ථාවක එම පුරප්පාඩුව හෝ පුරප්පාඩු කිහිපය හෝ පිරවීම පිළිබඳ මවිසින් තීරණය කරනු ලැබේ.

06. *අයදුම්කරුවන්ට අවශ්‍ය සුදුසුකම්* : අපේක්ෂකයින් අවම වශයෙන් පහත දැක්වෙන සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබිය යුතුය.

6.1 අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පූර්වාසන්න වර්ෂ හයක (06) කාල සීමාවක් ඇතුළත අපේක්ෂකයා තමා තනතුරට පත්වීමට බලාපොරොත්තුවන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ අවම වශයෙන් වසර තුනක් (03) අඛණ්ඩව ස්ථිරව පදිංචිව සිටිය යුතුය.ඒ බව පහත සඳහන් සහතිකවලින් එකක් මගින් තහවුරු කළ යුතුය.

1. ඡන්දහිමි නාම ලේඛනය
2. ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලද පදිංචි සහතිකය

6.2 *වයස් සීමාව* - අයදුම්කරු අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 21ට නොඅඩු සහ 35 ට නොවැඩි අයකු විය යුතුය.(ඒ අනුව 2000.06.28 වැනි දින හෝ ඊට පෙර හා 1986.06.28 වැනි දින හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)

6.3 *අධ්‍යාපන සුදුසුකම්* - අයදුම්කරුවන්ට පහත සඳහන් පරිදි අධ්‍යාපන සුදුසුකම් තිබිය යුතුය.

(*අ*) පළමු භාෂාව ලෙස සිංහල හෝ දෙමළ භාෂා අතරින් එක් භාෂා විෂයයක් හා ගණිතය ඇතුළුව අවම වශයෙන් විෂයයන් හතරකට (04) සම්මාන හතරක් සමග විෂයයන් හයකින් (06) එක වරකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම;

සහ

(*ආ*) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා ඉංග්‍රීසි භාෂා පරීක්ෂණය හැර) එකවර සමත්වීම. පැරණි විෂය නිර්දේශය යටතේ විෂයයන් තුනකින් (03) එකවර සමත්වීම ප්‍රමාණවත් වේ.

6.4 අපේක්ෂකයින්-

1. උපතින් හෝ ලියාපදිංචියෙන් ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතු ය;
2. සාපරාධී ක්‍රියාවන් සම්බන්ධව අධිකරණයේ වරදකරුවකු කරනු ලැබූවකු නොවිය යුතු අතර ඉතා හොඳ චරිතයකින් යුත් අයකු විය යුතු ය;
3. රජයේ හෝ රජයේ සංස්ථාවක හෝ රජයේ ව්‍යවස්ථාපිත ආයතනයක සේවයෙන් පහකළ අයකු, සේවය හැරගිය අයකු හෝ අකාර්යක්ෂමතාව මත විශ්‍රාම ගැන් වූ අයකු හෝ නොවිය යුතු ය;
4. වස්තු භංගත්වයට පත් වී ඇති තැනැත්තකු නොවිය යුතු ය;
5. යම් ආගමක හෝ ආගමික නිකායක පැවිදිවරයක් දරන තැනැත්තකු නොවිය යුතු ය;

07. *තනතුරට අදාළ මාසික වැටුප් ක්‍රමය* :

වැටුප් පරිමාණය - රු.28,940-10 x 300-11 x 350-10 x 560-10 x 660-රු.47,990.

(අංක 03/2016 හා 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි උපලේඛනය (ii) හි විධිවිධානයන්ට යටත්ව ගෙවීම් කරනු ලැබේ.)

08. *සේවා කොන්දේසි* :

8.1 බඳවා ගැනීම සිදු කරනු ලබන්නේ ග්‍රාම නිලධාරි සේවයේ III වැනි ශ්‍රේණියට ය.

8.2 මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත වේ. විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතුය. වැන්දඹු අනත්දරු/පුරුෂ අරමුදල සඳහා දායක විය යුතු ය. මාස 03ක පුහුණු කාලය ග්‍රාම නිලධාරි සේවා කාලයට ගණන් ගනු නොලැබේ.

8.3 මුල් පත්වීම් දින සිට වසර තුනක් පත්කරනු ලබන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ අනිවාර්යයෙන් සේවය කළ යුතු ය.

8.4 සතියට එක් විවේක දිනයක් හිමි අතර එම දිනය හැර සතියේ අනෙක් දිනයන්හි පැය 24 තුළ රාජකාරි සඳහා පත්කරනු ලබන ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ රාජකාරි ඉටු කිරීම සඳහා බැඳී සිටියි.

8.5 මෙම තනතුර සඳහා පත්වන අයකු අනුමත බඳවා ගැනීම් පටිපාටියේ, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය සංග්‍රහයේ, ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසිවල සඳහන් විධිවිධාන රෙගුලාසිවලට ද රජය විසින් පනවන ලද හා ඉදිරියේ දී පනවනු ලබන රෙගුලාසි හා විධිවිධානවලට ද යටත් වේ.

09. *අයදුම්පත් එවිය යුතු ආකාරය* :

9.1 ආදර්ශ ආකෘතියට අනුව සකස් කරන ලද අයදුම්පත් 2021.06.28 දිනට හෝ ඊට පෙර විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ යන ලිපිනයට ලේඛනගත තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලූ කවරයේ වම් ඉහළ කෙළවර "ග්‍රාම නිලධාරි III වැනි ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වන තරග විභාගය 2020(2021)" යනුවෙන් සඳහන් කළ යුතුය.

9.2 අයදුම්පත්‍ර, ආදර්ශ අයදුම්පත් ඒ-4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිතා කරමින් ශීර්ෂ අංක 10 දක්වා මුල් පිටුවේ ද ඉතිරිය අනෙක් පිටුවලට ද ඇතුළත් වන පරිදි මුද්‍රණය කර හෝ යතුරු ලියනය කර අපේක්ෂකයාගේ අත් අකුරෙන් සම්පූර්ණ කළ යුතුය. අයදුම්පත් පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්වල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද දෙමළ අයදුම්පත්වල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතුය.

9.3 අයදුම්පතේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් ආයතනයකින් විභාගයට ඉල්ලුම් කරන අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා ද, එසේ නොවන අයදුම්කරුවකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරීවරයකු, සාමදාන විනිශ්වයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතීඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියකු, රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.

9.4 දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සිය අයදුම්පත තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් එවිය යුතුය.

9.5 විභාග ගාස්තු වශයෙන් රු. 600 ක මුදලක් අයකරනු ලැබේ. අයදුම්කරුගේ නමින් මෙම විභාගයට අදාළව පමණක් එම මුදල ඕනෑම තැපැල්/උපතැපැල් කාර්යාලයකට, විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ අංක 20-03-02-13 ට බැර කර ලබා ගන්නා ලද කුවිතාන්සිය විභාග අයදුම්පතට අමුණා තිබිය යුතු ය. (කුවිතාන්සි අංකය, දිනය හා තැපැල් කාර්යාලය පැහැදිලිව සඳහන් කර තිබිය යුතුය.) ගෙවන ලද විභාග ගාස්තු මොනයම් හේතුවක් නිසාවත් ආපසු නොගෙවනු ලබන අතර, මෙම විභාග ගාස්තු කිසියම් විභාගයකට මාරු කිරීමට ද සලකා බලනු නොලැබේ. කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

9.6 අසම්පූර්ණ හා අවිධිමත් අයදුම්පත් කිසිම දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. උදාහරණ වශයෙන් 9.2 ඡේදයේ සඳහන් ආකාරයට අනනුකූලව අයදුම්පත සකස් කිරීම, කියවීමට අපහසු ආකාරයට අපැහැදිලි ලෙස අයදුම්පත සම්පූර්ණ කිරීම, පත්වීම අපේක්ෂා කරන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය හා අංකය නිවැරදිව ඇතුළත් නොකිරීම, අයදුම්කරු අත්සන් කර නොතිබීම, විභාග ගාස්තු ගෙවන ලද කුවිතාන්සිය අලවා නොතිබීම ආදී කරුණු දැක්විය හැකිය.

10. *විභාගයට පෙනී සිටීම හා ප්‍රතිඵල නිකුත් කිරීම* :

10.1. විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත ;
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය ;
III. වලංගු ශ්‍රී ලාංකික රියැදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

10.2. අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී නියමිත විභාග අංකය යටතේ විභාගයට පෙනී සිටිය යුතුය. විභාගයට පෙනී සිටින සෑම අපේක්ෂකයකුම විභාග දිනයේ තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ශාලාධිපති වෙත භාරදිය යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

10.3. *ප්‍රතිඵල නිකුත් කිරීම* :

*ගැසට්* නිවේදනයේ 4.4 ඡේදයට අනුව ලිඛිත පරීක්ෂණයෙන් සුදුසුකම් ලැබූවන්ගේ නාම ලේඛන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව වෙන් වෙන් වශයෙන් ලේකම්, ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය වෙත ලබාදෙනු ඇත. සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලැබීමෙන් අනතුරුව සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් ලැබූ සියලුම අයදුම්කරුවන්ගේ ලිඛිත හා සම්මුඛ පරීක්ෂණ ලකුණුවල මුළු ලකුණු ප්‍රමුඛතාව මත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමෙන් සකස් කළ ප්‍රතිඵල ලේඛන ලේකම්, ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය වෙත ලබාදෙනු ඇත.

පසුව, *ගැසට්* නිවේදනයේ 05.(i) හි (අ) සහ 4.4 ඡේදයට අනුව ලිඛිත පරීක්ෂණයෙන් සුදුසුකම් ලැබූවන්ගේ නාම ලේඛන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා දිස්ත්‍රික් මට්ටමින් පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව වෙන් වෙන් වශයෙන් ලේකම්, ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය වෙත ලබාදෙනු ඇත. සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලැබීමෙන් අනතුරුව සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් ලැබූ සියලු අයදුම්කරුවන්ගේ ලිඛිත හා සම්මුඛ පරීක්ෂණ ලකුණුවල මුළු ලකුණු ප්‍රමුඛතාව මත දිස්ත්‍රික් මට්ටමෙන් සකස් කළ ප්‍රතිඵල ලේඛන ලේකම්, ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය වෙත ලබාදෙනු ඇත.

ඉන් පසුව, *ගැසට්* නිවේදනයේ 05.(i) හි (ආ) සහ 4.4 ඡේදයට අනුව ලිඛිත පරීක්ෂණයෙන් සුදුසුකම් ලැබූවන්ගේ නාම ලේඛන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පළාත් මට්ටමින් පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව වෙන් වෙන් වශයෙන් ලේකම්, ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය වෙත ලබාදෙනු ඇත. සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලැබීමෙන් අනතුරුව සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් ලැබූ සියලුම අදුම්කරුවන්ගේ ලිඛිත හා සම්මුඛ පරීක්ෂණ ලකුණුවල මුළු ලකුණු ප්‍රමුඛතාව මත පළාත් මට්ටමෙන් සකස් කළ ප්‍රතිඵල ලේඛන ලේකම්, ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය වෙත ලබාදෙනු ඇත.

විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව ප්‍රතිඵල දන්වා යැවීම හෝ www.results.exams.gov.lk වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කිරීම ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ දැනුම් දීම අනුව සිදුකරනු ඇත.

11. සියලු විභාග අපේක්ෂකයින් රජයේ *ගැසට් පත්‍රයේ* පළකරන විභාග නීතිරීති පිළිබඳ අවබෝධයක් ලබා සිටිය යුතු අතර, ඒවා පිළිපැදීමට බැඳී සිටිය යුතුය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට අපේක්ෂකයින්ට සිදු වේ.

12. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකෙන අතර අයදුම්පත් වැරදි සහගතව හා අසම්පූර්ණව ඉදිරිපත් කර යම්කිසි අවාසියක් වෙතොත් අපේක්ෂකයා විසින්ම එය විඳ දරාගත යුතුය. එවැනි කරුණු සම්බන්ධ කිසිදු ඉල්ලීමක් සලකා බලනු නොලැබේ.

13. බඳවා ගැනීම් සිදු කරනු ලබන්නේ කිනම් දිනකට අදාළව පවතින පුරප්පාඩු සංඛ්‍යාව මත ද යන්න මවිසින් තීරණය කරනු ලබන අතර, එසේ තීරණය කරනු ලබන දිනය වන විට වාර්ෂික ස්ථාන මාරු කිරීම් හේතුවෙන් 1 වැනි උපලේඛනයේ සඳහන් සමහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පුරප්පාඩු සම්පූර්ණ වී තිබීමට ඉඩ ඇති බව අපේක්ෂකයින්ගේ අවධානයට ලක්කරනු ලැබේ. එවැනි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලින් ඉදිරිපත් වන අපේක්ෂකයින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් බඳවා ගැනීමේදී වෙනත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක පවතින පුරප්පාඩු සඳහා සුදුසුකම් ලැබීමට හිමිකම් නොලබන බව ද අවධාරණය කරනු ලැබේ.

14. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ වන, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමඟ විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නම හා අංකය, දිස්ත්‍රික්කයේ නම හා අංකය, අයදුම්කරුගේ අත්සන හා අත්සන සහතික කිරීම ද අදාළ නම් පමණක් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය ද සහිතව නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලබන අතර, මූලික සුදුසුකම් නොමැති බව සම්මුඛ පරීක්ෂණයේ දී හෝ පසු අවස්ථාවක දී හෝ අනාවරණය වුවහොත් විභාග යේ ප්‍රතිඵල මෙම තනතුර ලබා ගැනීම සඳහා සුදුසුකමක් ලෙස සලකනු නොලැබේ. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළකරනු ඇත. නිවේදනයේ සඳහන් විභාගය පැවැත්වෙන දිනයට අවම වශයෙන් දින 05කට වත් පෙර තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය සහ ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම්, එම විස්තර සමග ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබාගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පතේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේදී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

15. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

16. මෙම නිවේදනය මගින් අනාවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අයිතිය ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා සතුය.

එන්.එච්.එම්.චිත්‍රානන්ද,
ලේකම්,
ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය.

2021 මැයි මස 13 වැනි දින,
ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය,
"නිල මැදුර", ඇල්විටිගල මාවත,
කොළඹ 05.

**ආදර්ශ අයදුම්පත**

| |
|---|
| |

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි

**ග්‍රාම නිලධාරි III ශ්‍රේණියට බඳවා ගැනීමේ තරග විභාගය - 2020(2021)**

COMPETITIVE EXAMINATION FOR RECRUITMENT TO GRADE III OF GRAMA NILADHARI -2020 (2021)

01. පත්වීම සඳහා අයදුම් කරනු ලබන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නම හා අංකය

නම : ........................................ අංකය : | | | | |

(උපලේඛන I හි සඳහන් පරිදි අදාළ වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නම හා අංකය නිවැරදිව සඳහන් කළ යුතුය. එය පසු අවස්ථාවකදී වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පූර්වාසන්න වර්ෂ හයක (06) කාල සීමාවක් ඇතුළත තමා තනතුරට පත්වීමට බලාපොරොත්තුවන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ අවම වශයෙන් වසර තුනක් (03) අඛණ්ඩව ස්ථිරව පදිංචිව සිටිය යුතුය.)

02. පත්වීම සඳහා අයදුම් කරනු ලබන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අයත් දිස්ත්‍රික්කයේ නම හා අංකය

නම : ................................. අංකය : | | | | |

03. පත්වීම සඳහා අයදුම් කරනු ලබන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය අයත් පළාතේ නම හා අංකය

නම : ................................. අංකය : | | | | |

04. විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය

සිංහල - 2
දෙමළ - 3 භාෂා මාධ්‍යය : ..................... අංකය : | |
ඉංග්‍රීසි - 4
(අදාළ භාෂා මාධ්‍යය හා අංකය කොටුව තුළ ලියන්න. මෙය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.)

05. 5.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ....................................................................

(උදා:-HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

5.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුවද යොදා නම:-
(ඉංග්‍රිසි කැපිටල් අකුරෙන්)

...................................................................................................................

(උදා:- GUNAWARDHANA, H. M. S. K.)

5.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්): - ......................................................................

06. 6.1 ස්ථිර ලිපිනය : .................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

6.2 ස්ථිර ලිපිනය : ..................................................................................
(සිංහලෙන්/දෙමළෙන්)

07. ස්ත්‍රී/පුරුෂ භාවය : | | පුරුෂ 0 (අදාළ කොටුව තුළ අංකය ලියන්න)
ස්ත්‍රී - 1

08. ඔබ ශ්‍රී ලංකික පුරවැසියකු වන්නේ -
පරම්පරාවෙන් - 1
ලියාපදිංචි වීමෙන් - 2 (අදාළ කොටුව තුළ අංකය ලියන්න)

09. 9.1 ජාතික හැඳුනුම්පත් අංකය

9.2 උපන් දිනයː- වර්ෂය ː මාසය ː දිනය ː

9.3 සුදුසුකම් සැපිරිය යුතු 2021.06.28 දිනට වයස ː

අවුරුදු ː මාස ː දින ː

10. ජංගම දුරකථන අංකයː

11. ස්ථිර පදිංචි ග්‍රාම නිලධාරි කොට්ඨාසය හා අංකය ː ..............................

12. අධ්‍යාපන සුදුසුකම් ː

12.1 අ.පො.ස. (සා.පෙ.)/ සුදුසුකම් ලැබූ විභාගයේ විස්තර
විභාගයේ නම ː .............................................
වර්ෂය ː .......................................... විභාග අංකය ː .........................................

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1 | | 6 | |
| 2 | | 7 | |
| 3 | | 8 | |
| 4 | | 9 | |
| 5 | | 10 | |

12.2 අ.පො.ස. (උ.පෙ.) සුදුසුකම් ලැබූ විභාගයේ විස්තර

වර්ෂය ː ........................... විභාග අංකය ː ............................................

| *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 | |

13. වෙනත් සුදුසුකම් ː ..........................................................................................................................................................
..........................................................................................................................................................
..........................................................................................................................................................

14. ඔබට විරුද්ධව මීට පෙර කවර හෝ චෝදනාවක් සම්බන්ධව අධිකරණය ඉදිරියේ නඩු පැවරීමක් හෝ උසාවියකින් වරදකරු වී ඇති අයකුද යන වග - ඔව්/නැත
ඔව් නම් (i) උසාවිය හා නඩු අංකය ː .........................................................
(ii) චෝදනාව ː ..................................................................................
(iii) අධිකරණ තීන්දුව/දඬුවම ː .........................................................

15. ඔබ මීට පෙර රජයේ හෝ පළාත් සභාවක හෝ සංස්ථාවක හෝ අධිකාරියක හෝ රජයට අනුබද්ධ ආයතනයක හෝ සේවය කර විනය හේතුවක් මත සේවයෙන් පහකර ඇත්තා වූ හෝ අකාර්යක්ෂමතාව මත විශ්‍රාම ගැන් වූ හෝ සේවය හැර ගියා වූ තැනැත්තකු ද යන වග - ඔව්/නැත (ඔව් නම් විස්තර සඳහන් කරන්න.)
..................................................................................................................................................
..................................................................................................................................................

16. අයදුම්කරුගේ සහතිකය

(අ) මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍යය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි.

(ආ) මෙම අයදුම්පත හැරුණු විට මෙම විභාගය සඳහා මෙම *ගැසට්* නිවේදනය අනුව වෙනත් අයදුම්පතක් මා විසින් ඉදිරිපත් කර නොමැති බව අවංකව ප්‍රකාශ කර සිටිමි.

(ඇ) විභාග ගාස්තු වශයෙන් රුපියල් ...........ක් ගෙවන ලදී. ලදුපත් අංකය...........
ගෙවූ තැපැල් කාර්යාලය ..............
දිනය .................................

| ලදු පත නොගැලවෙන සේ මෙහි අලවන්න |
|---|

(ඈ) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන තීරණවලට මම යටත් වන බව ප්‍රකාශ කරමි.

(ඉ) මා විසින් ඉහත සඳහන් කර ඇති තොරතුරු හා කරනු ලැබ ඇති ප්‍රකාශය මා සේවයට බඳවා ගැනීමට පෙර අසත්‍ය බැව් ඔප්පු වුවහොත් මෙම තනතුරට නුසුදුස්සකු වන බව හා එම තනතුරට පත්වීම් ලැබීමෙන් පසු එසේ ඔප්පු වුවහොත් සේවය අවසන් කිරීමට හෝ සේවයෙන් පහ කරනු ලැබීමට හෝ යටත්වන බව මම දැන සිටිමි.

................................,
අයදුම්කරුගේ අත්සන

දිනය.......................

17. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම
මෙම අයදුම්පතඉදිරිපත් කරන ................................. මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ඇය 202../.../.... දින මා ඉදිරිපිට දී මෙම අයදුම්පත අත්සන් කළ බවත්, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති මෙයින් සහතික කරමි.

.........................................,
සහතික කරන්නාගේ අත්සන

නම :- ..........................................................................................................
පදවි නාමය :- ..........................................................................................
දිනය :- ........................................................................................................
(නිල මුද්‍රාව යොදන්න)

18. දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් සඳහා :

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ...................... මයා/මිය/මෙනවිය අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ ............. දින සිට .................... තනතුරෙහි සේවය කරන බවත්, ඔහුගේ/ ඇයගේ සේවය සතුටුදායක බවත්, ඉහත සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බවත් සහතික කරමි. තව ද ඔහු/ ඇය මෙම තනතුරට තෝරාගතහොත් වත්මන් තනතුරේ සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් ප්‍රකාශ කර සිටිමි.

.................................................,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
(නිලමුද්‍රාව සහිතව)

දිනය : .........................

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2147/28 හා 2019.10.29 දිනැති අති *විශෙෂ ගැසට් නිවේදනය* මගින් නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කයේ නව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10ක් ද, ගාල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ නව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05ක් ද, රත්නපුර පරිපාලන දිස්ත්‍රික්කයේ නව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02ක් ද, ස්ථාපිත කර ඇත. එහෙත් එම නව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පරිපාලන කටයුතු තවමත් ස්ථාපිත වෙමින් පවතින බැවින් මෙම විභාගය සඳහා අයදුම් කිරීමේදී උක්ත *ගැසට් නිවේදනය* නිකුත් කිරීමට පෙර පැවති පහත උපලේඛනයෙ I හි ඇතුළත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස යටතේ අයදුම්කළ යුතු ය. (මෙය නුවරඑළිය, ගාල්ල හා රත්නපුර යන පරිපාලන දිස්ත්‍රික්කවලට පමණක් අදාළ වේ)

**උපලේඛනය I**

| *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය* | *අයත් දිස්ත්‍රික්කය හා අංකය* | *අයත් පළාත හා අංකය* |
|---|---|---|---|
| කොළඹ | 1103 | 01 කොළඹ | 01 බස්නාහිර පළාත |
| කොළොන්නාව | 1106 | | |
| කඩුවෙල | 1109 | | |
| හෝමාගම | 1112 | | |
| හංවැල්ල | 1115 | | |
| පාදුක්ක | 1118 | | |
| මහරගම | 1121 | | |
| ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ | 1124 | | |
| තිඹිරිගස්යාය | 1127 | | |
| දෙහිවල | 1130 | | |
| රත්මලාන | 1131 | | |
| මොරටුව | 1133 | | |
| කැස්බෑව | 1136 | | |
| මීගමුව | 1203 | 02 ගම්පහ | |
| කටාන | 1206 | | |
| දිවුලපිටිය | 1209 | | |
| මීරිගම | 1212 | | |
| මිනුවන්ගොඩ | 1215 | | |
| වත්තල | 1218 | | |
| ජා ඇල | 1221 | | |
| ගම්පහ | 1224 | | |
| අත්තනගල්ල | 1227 | | |
| දොම්පේ | 1230 | | |
| මහර | 1233 | | |
| කැලණිය | 1236 | | |
| බියගම | 1239 | | |

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය | අයත් දිස්ත්‍රික්කය හා අංකය | අයත් පළාත හා අංකය |
|---|---|---|---|
| පානදුර | 1303 | 03 කළුතර | 01 බස්නාහිර පළාත |
| බණ්ඩාරගම | 1306 | | |
| හොරණ | 1309 | | |
| ඉංගිරිය | 1310 | | |
| බුලත්සිංහල | 1312 | | |
| මදුරාවල | 1315 | | |
| මිල්ලනිය | 1318 | | |
| කළුතර | 1321 | | |
| බේරුවල | 1324 | | |
| දොඩන්ගොඩ | 1327 | | |
| මතුගම | 1330 | | |
| අගලවත්ත | 1333 | | |
| පාලින්දනුවර | 1336 | | |
| වලල්ලාවිට | 1339 | | |
| තුම්පනේ | 2103 | 04 මහනුවර | 02 මධ්‍යම පළාත |
| පූජාපිටිය | 2106 | | |
| අකුරණ | 2109 | | |
| පාතදුම්බර | 2112 | | |
| පන්විල | 2115 | | |
| උඩුදුම්බර | 2118 | | |
| මිනිපේ | 2121 | | |
| මැදදුම්බර | 2124 | | |
| කුණ්ඩසාලේ | 2127 | | |
| ගඟවට කෝරළේ | 2130 | | |
| හාරිස්පත්තුව | 2133 | | |
| හතරලියද්ද | 2134 | | |
| යටිනුවර | 2136 | | |
| උඩුනුවර | 2139 | | |
| දොළුව | 2142 | | |
| පාතහේවාහැට | 2145 | | |
| දෙල්තොට | 2148 | | |
| උඩපළාත | 2151 | | |
| ගඟඉහළ කෝරළේ | 2154 | | |
| පස්බාගේ කෝරළේ | 2157 | | |

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය | අයත් දිස්ත්‍රික්කය හා අංකය | අයත් පළාත හා අංකය |
|---|---|---|---|
| ගලේවෙල | 2203 | 05 මාතලේ | 02 මධ්‍යම පළාත |
| දඹුල්ල | 2206 | | |
| නාඋල | 2209 | | |
| පල්ලේපොල | 2212 | | |
| යටවත්ත | 2215 | | |
| මාතලේ | 2218 | | |
| අඹන්ගඟ කෝරළේ | 2221 | | |
| ලග්ගල පල්ලේගම | 2224 | | |
| විල්ගමුව | 2227 | | |
| රත්තොට | 2230 | | |
| උකුවෙල | 2233 | | |
| | | | |
| කොත්මලේ | 2303 | 06 නුවරඑළිය | |
| හඟුරන්කෙත | 2306 | | |
| වලපනේ | 2309 | | |
| නුවරඑළිය | 2312 | | |
| අඹගමුව | 2315 | | |
| | | | |
| බෙන්තොට | 3103 | 07 ගාල්ල | 03 දකුණු පළාත |
| බලපිටිය | 3106 | | |
| කරන්දෙණිය | 3109 | | |
| ඇල්පිටිය | 3112 | | |
| නියාගම | 3115 | | |
| තවලම | 3118 | | |
| නෙළුව | 3121 | | |
| නාගොඩ | 3124 | | |
| බද්දේගම | 3127 | | |
| වැලිවිටිය දිවිතුර | 3130 | | |
| අම්බලන්ගොඩ | 3133 | | |
| හික්කඩුව | 3136 | | |
| කඩවත්සතර | 3139 | | |
| බෝපෙ පෝද්දල | 3142 | | |
| අක්මීමන | 3145 | | |
| යක්කලමුල්ල | 3148 | | |
| ඉමදූව | 3151 | | |
| ගෝනාපීනුවල | 3154 | | |
| හබරාදූව | 3157 | | |

| *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය* | *අයත් දිස්ත්‍රික්කය හා අංකය* | *අයත් පළාත හා අංකය* |
|---|---|---|---|
| පිටබැද්දර | 3203 | 08 මාතර | 03 දකුණු පළාත |
| කොටපොල | 3206 | | |
| පස්ගොඩ | 3209 | | |
| මුලටියන | 3212 | | |
| අතුරලිය | 3215 | | |
| අකුරැස්ස | 3218 | | |
| වැලිපිටිය | 3221 | | |
| මාලිම්බඩ | 3224 | | |
| කඹුරුපිටිය | 3227 | | |
| හක්මන | 3230 | | |
| කිරින්ද පුහුල්වැල්ල | 3233 | | |
| තිහගොඩ | 3236 | | |
| වැලිගම | 3239 | | |
| මාතර | 3242 | | |
| දෙවිනුවර | 3245 | | |
| දික්වැල්ල | 3248 | | |
| | | | |
| සූරියවැව | 3303 | 09 හම්බන්තොට | |
| ලුණුගම්වෙහෙර | 3306 | | |
| තිස්සමහාරාමය | 3309 | | |
| හම්බන්තොට | 3312 | | |
| අම්බලන්තොට | 3315 | | |
| අඟුණකොළපැලැස්ස | 3318 | | |
| වීරකැටිය | 3321 | | |
| කටුවන | 3324 | | |
| ඕකේවෙල | 3327 | | |
| බෙලිඅත්ත | 3330 | | |
| තංගල්ල | 3333 | | |
| වලස්මුල්ල | 3336 | | |
| | | | |
| කයිට්ස් | 4103 | 10 යාපනය | 04 උතුරු පළාත |
| චාවක්කනි | 4106 | | |
| සන්දිලිපායි | 4109 | | |
| තෙලිප්පායි | 4112 | | |
| උඩුවිල් | 4115 | | |
| කෝපායි | 4118 | | |
| කරවෙඩ්ඩි | 4121 | | |
| මුරුතන්කර්නි | 4124 | | |

| *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අංකය* | *අයත් දිස්ත්‍රික්කය හා අංකය* | *අයත් පළාත හා අංකය* |
|---|---|---|---|
| පොයින්ට් පේද්‍රු | 4127 | 10 යාපනය | 04 උතුරු පළාත |
| චාවකච්චේරි | 4130 | | |
| නල්ලූර් | 4133 | | |
| යාපනය | 4136 | | |
| වෙලනායි | 4139 | | |
| ඩෙල්ෆ් | 4142 | | |
| කරෙයිනගර් | 4145 | | |
| | | | |
| මන්නාරම | 4203 | 11 මන්නාරම | |
| මාන්තායි බටහිර | 4206 | | |
| මඩු | 4209 | | |
| නානද්දාන් | 4212 | | |
| මුසාලි | 4215 | | |
| | | | |
| වවුනියා උතුර | 4303 | 12 වවුනියා | |
| වවුනියා දකුණ | 4306 | | |
| වවුනියා | 4309 | | |
| වෙන්ගලචේඩිකුලම් | 4312 | | |
| | | | |
| තුනුක්කායි | 4403 | 13 මුලතිව් | |
| මාන්තායි නැගෙනහිර | 4406 | | |
| පුදුකුඩිඉරුප්පු | 4409 | | |
| ඔඩ්ඩුසුඩාන් | 4412 | | |
| මැරිටයිම්පත්තු | 4415 | | |
| වැලිඔය | 4418 | | |
| | | | |
| පච්චිලෙයිපල්ලි | 4503 | 14 කිලිනොච්චි | |
| කඳවලෙයි | 4506 | | |
| කරච්චි | 4509 | | |
| පූනාකරි | 4512 | | |
| | | | |

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය | අයත් දිස්ත්‍රික්කය හා අංකය | අයත් පළාත හා අංකය |
|---|---|---|---|
| කෝරළේපත්තු උතුර | 5103 | 15 මඩකලපුව | 05 නැගෙනහිර පළාත |
| කෝරළේපත්තු බටහිර | 5106 | | |
| කෝරළේපත්තු | 5109 | | |
| ඒරාවුර්පත්තු | 5112 | | |
| ඒරාවුර් නගරය | 5115 | | |
| මන්මුනේ උතුර | 5118 | | |
| මන්මුලේ බටහිර | 5121 | | |
| කාත්තන්කුඩි | 5124 | | |
| මන්මුනේපත්තු | 5127 | | |
| මන්මුනේ නිරිත | 5130 | | |
| පෝර්තිව්පත්තු | 5133 | | |
| මන්මුනේ උතුර | 5136 | | |
| කෝරළේපත්තු දකුණ | 5139 | | |
| කෝරළේපත්තු මධ්‍යම | 5142 | | |
| | | 16 අම්පාර | |
| දෙහිඅත්තකණ්ඩිය | 5203 | | |
| පදියතලාව | 5206 | | |
| මහඔය | 5209 | | |
| උහන | 5212 | | |
| අම්පාර | 5215 | | |
| නාවින්දවේලි | 5216 | | |
| සමන්තුරෙයි | 5218 | | |
| කල්මුණේ දමිළ | 5224 | | |
| සයින්ද මුරුදු | 5225 | | |
| කාර්තිවු | 5227 | | |
| නින්දවුර් | 5230 | | |
| අඩ්ඩාලච්චේන | 5233 | | |
| ඉරක්කාමම් | 5234 | | |
| අක්කරපත්තුව | 5236 | | |
| අලයඩිවෙම්බු | 5239 | | |
| දමන | 5242 | | |
| තිරුක්කෝවිල් | 5245 | | |
| පොතුවිල් | 5248 | | |
| ලාහුගල | 5251 | | |
| කල්මුනේ මුස්ලිම් | 5254 | | |

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය | අයත් දිස්ත්‍රික්කය හා අංකය | අයත් පළාත හා අංකය |
|---|---|---|---|
| පදවි ශ්‍රී පුර | 5303 | 17 ත්‍රිකුණාමලය | 05 නැගෙනහිර පළාත |
| කුච්චවේලි | 5306 | | |
| ගෝමරන්කඩවල | 5309 | | |
| මොරවැව | 5312 | | |
| නගර හා කඩවත් | 5315 | | |
| තඹලගමුව | 5318 | | |
| කන්තලේ | 5321 | | |
| කින්නියා | 5324 | | |
| මුතූර් | 5327 | | |
| සේරුවිල | 5330 | | |
| වෙරුගල් / ඉච්චලම්පත්තු | 5333 | | |
| | | | |
| ගිරිබාව | 6103 | 18 කුරුණෑගල | 06 වයඹ පළාත |
| ගල්ගමුව | 6106 | | |
| ඇහැටුවැව | 6109 | | |
| අඹන්පොල | 6112 | | |
| කොටවෙහෙර | 6115 | | |
| රස්නායකපුර | 6118 | | |
| නිකවැරටිය | 6121 | | |
| මහව | 6124 | | |
| පොල්පිතිගම | 6127 | | |
| ඉබ්බාගමුව | 6130 | | |
| ගනේවත්ත | 6133 | | |
| වාරියපොල | 6136 | | |
| කොබෙයිගනේ | 6139 | | |
| බිංගිරිය | 6142 | | |
| බමුණාකොටුව | 6149 | | |
| මාස්පොත | 6151 | | |
| කුරුණෑගල | 6154 | | |
| මල්ලවපිටිය | 6157 | | |
| මාවතගම | 6160 | | |
| රිදීගම | 6163 | | |
| වීරඹුගෙදර | 6166 | | |
| කුලියාපිටිය නැගෙනහිර | 6169 | | |
| කුලියාපිටිය බටහිර | 6172 | | |
| උඩුබද්දාව | 6175 | | |
| පන්නල | 6178 | | |
| නාරම්මල | 6181 | | |
| අලව්ව | 6184 | | |
| පොල්ගහවෙල | 6187 | | |
| පඩුවස්නුවර නැගෙනහිර | 6190 | | |
| පඩුවස්නුවර බටහිර | 6193 | | |

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය | අයත් දිස්ත්‍රික්කය හා අංකය | අයත් පළාත හා අංකය |
|---|---|---|---|
| කල්පිටිය | 6203 | 19 පුත්තලම | 06 වයඹ පළාත |
| වනාතවිල්ලුව | 6206 | | |
| කරුවලගස්වැව | 6209 | | |
| නවගත්තේගම | 6212 | | |
| පුත්තලම | 6215 | | |
| මුන්දලම | 6218 | | |
| මහකුඹුක්කඩවල | 6221 | | |
| ආණමඩුව | 6224 | | |
| පල්ලම | 6227 | | |
| ආරච්චිකට්ටුව | 6230 | | |
| හලාවත | 6233 | | |
| මාදම්පෙ | 6236 | | |
| මහවැව | 6239 | | |
| නාත්තන්ඩිය | 6242 | | |
| වෙන්නප්පුව | 6245 | | |
| දංකොටුව | 6248 | | |
| | | 20 අනුරාධපුරය | 07 උතුරු මැද පළාත |
| පදවිය | 7103 | | |
| කැබිතිගොල්ලෑව | 7106 | | |
| මැදවච්චිය | 7109 | | |
| මහවිලච්චිය | 7112 | | |
| මධ්‍යම නුවරගම්පළාත | 7115 | | |
| රඹෑව | 7118 | | |
| කහටගස්දිගිලිය | 7121 | | |
| හොරොව්පොතාන | 7124 | | |
| ගලෙන්බිඳුනුවැව | 7127 | | |
| මිහින්තලේ | 7130 | | |
| නැගෙනහිර නුවරගම්පළාත | 7133 | | |
| නච්චදූව | 7136 | | |
| නොච්චියාගම | 7139 | | |
| රාජාංගනය | 7142 | | |
| තඹුත්තේගම | 7145 | | |
| තලාව | 7148 | | |
| තිරප්පනේ | 7151 | | |
| කැකිරාව | 7154 | | |
| පළුගස්වැව | 7157 | | |
| ඉපලෝගම | 7160 | | |
| ගල්නෑව | 7163 | | |
| පලාගල | 7166 | | |

| *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය* | *අයත් දිස්ත්‍රික්කය හා අංකය* | *අයත් පළාත හා අංකය* |
|---|---|---|---|
| හිඟුරක්ගොඩ | 7203 | 21 පොළොන්නරුව | 07 උතුරු මැද පළාත |
| මැදිරිගිරිය | 7206 | | |
| ලංකාපුර | 7209 | | |
| වැලිකන්ද | 7210 | | |
| දිඹුලාගල | 7212 | | |
| තමන්කඩුව | 7215 | | |
| ඇලහැර | 7218 | | |
| | | | |
| මහියංගනය | 8103 | 22 බදුල්ල | 08 ඌව පළාත |
| රිදීමාලියද්ද | 8106 | | |
| මීගහකිවුල | 8109 | | |
| කන්දෙකැටිය | 8112 | | |
| සොරණාතොට | 8115 | | |
| පස්සර | 8118 | | |
| ලුණුගල | 8119 | | |
| බදුල්ල | 8121 | | |
| හාලිඇල | 8124 | | |
| ඌව පරණගම | 8127 | | |
| වැලිමඩ | 8130 | | |
| බණ්ඩාරවෙල | 8133 | | |
| ඇල්ල | 8136 | | |
| හපුතලේ | 8139 | | |
| හල්දුම්මුල්ල | 8142 | | |
| | | | |
| බිබිල | 8203 | 23 මොණරාගල | |
| මඩුල්ල | 8206 | | |
| මැදගම | 8209 | | |
| සියඹලාණ්ඩුව | 8212 | | |
| මොණරාගල | 8215 | | |
| බඩල්කුඹුර | 8218 | | |
| බුත්තල | 8221 | | |
| වැල්ලවාය | 8224 | | |
| කතරගම | 8227 | | |
| තණමල්විල | 8230 | | |
| සෙවණගල | 8233 | | |
| | | | |

| *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය* | *අයත් දිස්ත්‍රික්කය හා අංකය* | *අයත් පළාත හා අංකය* |
|---|---|---|---|
| ඇහැළියගොඩ | 9103 | 24 රත්නපුර | 09 සබරගමුව පළාත |
| කුරුවිට | 9106 | | |
| කිරිඇල්ල | 9109 | | |
| රත්නපුර | 9112 | | |
| ඉඹුල්පෙ | 9115 | | |
| බලංගොඩ | 9118 | | |
| ඕපනායක | 9121 | | |
| පැල්මඩුල්ල | 9124 | | |
| ඇලපාත | 9127 | | |
| අයගම | 9130 | | |
| කලවාන | 9133 | | |
| නිවිතිගල | 9136 | | |
| කහවත්ත | 9139 | | |
| ගොඩකවෙල | 9142 | | |
| වැලිගෙපොල | 9145 | | |
| ඇඹිලිපිටිය | 9148 | | |
| කොලොන්න | 9151 | | |
| | | | |
| රඹුක්කන | 9203 | 25 කෑගල්ල | |
| මාවනැල්ල | 9206 | | |
| අරණායක | 9209 | | |
| කෑගල්ල | 9212 | | |
| ගලිගමුව | 9215 | | |
| වරකාපොල | 9218 | | |
| රුවන්වැල්ල | 9221 | | |
| බුලත්කොහුපිටිය | 9224 | | |
| යටියන්තොට | 9227 | | |
| දෙහිඕවිට | 9230 | | |
| දැරණියගල | 9233 | | |

## කම්කරු අමාත්‍යාංශය

### කම්කරු දෙපාර්තමේන්තුවේ ලඝුලේඛක III ශ්‍රේණියේ තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2021

කම්කරු අමාත්‍යාංශයට අයත් කම්කරු දෙපාර්තමේන්තුවේ ලඝුලේඛක III ශ්‍රේණියේ 2021.03.31 දිනට පුරප්පාඩුව පවතින සිංහල මාධ්‍ය තනතුරු හතරක (04) හා ඉංග්‍රීසි මාධ්‍ය තනතුරු එකක (01) පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *පත්කිරීම* : කම්කරු අමාත්‍යාංශය යටතේ ඇති ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය මඟින් පවත්වනු ලබන ලිඛිත හා වෘත්තීය පරීක්ෂණයන්හි ප්‍රතිඵල මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින්ගෙන් කුසලතා අනු පිළිවෙල අනුව පුරප්පාඩු සඳහා බඳවා ගැනීම සිදුකරනු ලැබේ.

02. *සුදුසුකම්* :

2.1 අධ්‍යාපන සුදුසුකම් :

I. (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට (02) සම්මාන සාමාර්ථ සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා/පෙළ) විභාගය සමත් වීම

සහ

II. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගයේදී (නව විෂය නිර්දේශය යටතේ සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) අවම වශයෙන් එක් විෂයයකින් හෝ සමත් වීම

2.2 වෘත්තීය සුදුසුකම් :

2.2.1 *සිංහල ලඝුලේඛක තනතුරෙහි අයදුම්කරුවන් සඳහා* : තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක ලඝු ලේඛනය පිළිබඳ මාස හය (06) කට නොඅඩු සිංහල මාධ්‍ය පාඨමාලාවක් හදාරා තිබීම හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා/පෙළ) විභාගයේදී යතුරු ලියනය හා ලඝු ලේඛනය විෂයය ( සිංහල මාධ්‍ය) සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම

2.2.2 *ඉංග්‍රීසි ලඝුලේඛක තනතුරෙහි අයදුම්කරුවන් සඳහා* : තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක ලඝු ලේඛනය පිළිබඳ මාස හය (06) කට නොඅඩු ඉංග්‍රීසි මාධ්‍ය පාඨමාලාවක් හදාරා තිබීම හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා/පෙළ) විභාගයේදී යතුරු ලියනය හා ලඝු ලේඛනය විෂයය ( ඉංග්‍රීසි මාධ්‍ය) සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම

*සටහන*.- ලඝුලේඛනය හා පරිගණක යතුරු ලියනය සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අනුමත ආයතන පහත දැක්වේ :-

- කාර්මික හා අධ්‍යාපන පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් කාර්මික විද්‍යාල හා තාක්ෂණ විද්‍යාල
- ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරියට අයත් පුහුණු මධ්‍යස්ථාන
- ජාතික තරුණ සේවා සභාවට අයත් පුහුණු මධ්‍යස්ථාන
- ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියට අයත් පුහුණු මධ්‍යස්ථාන

2.3 පළපුරුද්ද :

ඉහත පාඨමාලාව හැදෑරීමෙන් අනතුරුව රජයේ පිළිගත් ආයතනයකින් මාස 06 ක ප්‍රායෝගික පුහුණුවක් ලබා තිබීම

2.4 වෙනත් සුදුසුකම් :

I. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
II. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
III. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් වන දිනට සෑම ආකාරයකින්ම එම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

03. *වයස් සීමාව :*

ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 30ට නොවැඩි විය යුතුය.

04. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :*

4.1 මෙම තනතුර ස්ථිරය. තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට නිලධාරීන් යටත් විය යුතුවේ.

4.2 මෙම පත්වීම අවුරුදු තුනක (03) පරිවාස කාලයකට යටත් වේ.

4.3 III ශ්‍රේණියට බඳවා ගෙන වසර තුන (03) ක් ගත වීමට පෙර I වන කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය.

4.4 රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගැනීම සම්බන්ධයෙන් 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හි විධිවිධාන හා ඊට ආනුෂාංගික වන චක්‍රලේඛවල විධිවිධාන මෙයට අදාල වේ.

4.5 රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති, මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහයේ විධිවිධානවලට සහ ඒවායේ සිදු කෙරෙන සංශෝධනවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද, 2013.04.11වැනි දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද බඳවා ගැනීම් පටිපාටියේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද එම බඳවා ගැනීම් පටිපාටියට මින් මතු කෙරෙන සංශෝධනවලට ද යටත්ව තෝරා ගනු ලබන අපේක්ෂකයින් ලඝු ලේඛක III ශ්‍රේණියේ තනතුරට පත් කරනු ලැබේ.

4.6 කොළඹ 05, නාරාහේන්පිට පිහිටි කම්කරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ පමණක් සේවයේ යොදවනු ලැබේ.

05. *තනතුරට අදාළ වැටුප් ක්‍රමය :*

මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 පරිදි MN 1- 2016 අනුව 27,140- 10 x 300- 11 x 350- 10 x 495- 10x660- 45,540/= මාසික වැටුප් පරිමාණයක් හිමිය.

06. *බඳවා ගැනීමේ ක්‍රමය :*

මෙම බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය ලිඛිත පරීක්ෂණයකින් හා වෘත්තීය පරීක්ෂණයකින් සමන්විතය. පළමුව ලිඛිත පරීක්ෂණය පැවැත්වෙන අතර එම ප්‍රශ්න පත්‍රයෙන් 40% ට වඩා ලකුණු ලබා ගන්නා අපේක්ෂකයින් වෘත්තීය පරීක්ෂණයට කැඳවනු ලැබේ. මෙම විභාගය තරඟ විභාගයක් බැවින් පත්වීම ලැබීමට සුදුසුකම් ලැබීම සඳහා එක් එක් විෂයය සඳහා වෙන් කර ඇති ලකුණු වලින් යටත් පිරිසෙයින් 40%ක් බැගින් වත් අපේක්ෂකයින් විසින් ලබා ගත යුතුය. තරඟ විභාගය සඳහා වෙන් කොට ඇති පුරප්පාඩු ගණන සපුරාලන පරිදි ලබාගත් මුළු ලකුණු අනුපිළිවෙල අනුගමනය කරමින් පුරප්පාඩු සම්පූර්ණ කරනු ලැබේ. (මෙම දැන්වීමේ සඳහන් සුදුසුකම් සියල්ලම සපුරා තිබීම අනිවාර්ය වේ.)

විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වෙන අතර,අයදුම්කරුවන්ට තමාට කැමති ඕනෑම භාෂා මාධ්‍යයකින් ලිඛිත විභාගය සඳහා පෙනී සිටිය හැකිය.ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.ලඝුලේඛක සිංහල තනතුර සඳහා අයදුම්කළ අයදුම්කරුවන්ගේ මුළු ලකුණු කුසලතාවය අනුව එම තනතුරු සඳහා ද ලඝුලේඛක ඉංග්‍රීසි තනතුර සඳහා අයදුම්කළ අයදුම්කරුවන්ගේ මුළු ලකුණු කුසලතාවය අනුව එම තනතුරු සඳහා ද පත් කිරීම සිදු කරනු ලැබේ.

6.1 ලිඛිත විභාගය සඳහා වන විෂය නිර්දේශය

| *ප්‍රශ්න පත්‍රය* | *උපරිම ලකුණු* | *සමත් ලකුණු* | *කාලය* |
|---|---|---|---|
| සාමාන්‍ය දැනීම සහ වාක්‍ය රචනය | 100 | 40 | පැය 02 |

(අ) ලිඛිත විභාගයේ විෂයය නිර්දේශයː

සාමාන්‍ය දැනීම හා වාක්‍ය රචනය

දේශීය හා ජාත්‍යන්තර ක්ෂේත්‍රවල කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය දැනීම පරීක්ෂා කිරීම,කාලීන වැදගත්කමින් යුත් දෙන ලද මාතෘකා අතුරින් තෝරාගත් මාතෘකාවක් යටතේ රචනාවක් ලිවීම (සුවිශේෂී අදහස් ඉදිරිපත් කිරීම, භාෂා කුසලතාව, නිවැරදි ව්‍යාකරණ හා අක්ෂර වින්‍යාසය කෙරෙහි සැලකිල්ලක් දක්වනු ලැබේ).

6.2 වෘත්තීය පරීක්ෂණය

| *විෂයය* | *උපරිම ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|
| ලඝු ලේඛනය හා පරිගණක යතුරු ලියනය (සිංහල/ඉංග්‍රීසි) | 100 | 40 |

(අ) වෘත්තීය පරීක්ෂණය සඳහා වන විෂය නිර්දේශය

I. සිංහල ලඝු ලේඛනය හා යතුරු ලියනය (සිංහල මාධ්‍ය අයදුම්කරුවන් සඳහා)
මිනිත්තු පහක් (5) තුළ නොකඩවා කියවනු ලබන ඡේදයක් මිනිත්තුවකට වචන 70 ක වේගයෙන් ලඝු සටහන් කරගෙන එම සටහන් මිනිත්තුවකට වචන 7 ක වේගයෙන් පරිගණක යතුරු ලියනය කිරීම.

*හෝ*

II. ඉංග්‍රීසි ලඝු ලේඛනය හා යතුරු ලියනය (ඉංග්‍රීසි මාධ්‍ය අයදුම්කරුවන් සඳහා)

මිනිත්තු පහක් (5) තුළ නොකඩවා කියවනු ලබන ඡේදයක් මිනිත්තුවකට වචන 80 ක වේගයෙන් ලඝු සටහන් කරගෙන එම සටහන් මිනිත්තුවකට වචන 7 ක වේගයෙන් පරිගණක යතුරු ලියනය කිරීම.

07. *විභාග ගාස්තු* :

අපේක්ෂකයා විසින්, පොදු 118 ආකෘති පත්‍රයේ විභාගයේ නම හා ලැබීම් ශීර්ෂය 2003.02.99 ලෙස සටහන් කර මෙම නිවේදනයේ පිටපතක් ද සමග අයදුම්පත් භාර ගන්නා අවසාන දින හෝ එදිනට පෙර විභාග ගාස්තු ලෙස රු.500.00ක මුදලක් නාරාහේන්පිට කම්කරු දෙපාර්තමේන්තුවේ සරප් අංශය වෙත හෝ අපේක්ෂකයාට ළඟා වීමට පහසු කම්කරු දෙපාර්තමේන්තුවේ වෙනත් ඕනෑම කාර්යාලයක මුදල් අයකැමිවරයකු වෙත හෝ ඉදිරිපත් කළ යුතු අතර මුදල් ගෙවා ලබා ගත් ලදුපත (පොදු 172) ඉල්ලුම් පත්‍රයේ අදාළ ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය.

(මෙම ලදුපතේ ඡායා පිටපතක් අපේක්ෂකයා ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

***සටහන.***- විභාගය අවලංගු කළහොත් මිස විභාග ගාස්තු කුමන හේතුවක් නිසාවත් නැවත ගෙවනු නොලැබේ. මෙම විභාගය සඳහා ගෙවනු ලැබූ විභාග ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමට ද නොහැකිය

08. *අයදුම් කිරීමේ ක්‍රමය* :

8.1 මෙම නිවේදනයේ අගට යොදා ඇති ආදර්ශ අයදුම් පත්‍රය අනුව A4 ප්‍රමාණයේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින්;

*අ)* අංක 01 සිට 2.4 තෙක් ඡේදයන් පළමුවන පිටුවට ද, අංක 03 සිට 05 දක්වා ඡේදයන් දෙවන පිටුවට ද,අංක 06 සිට 09 (ඇ) දක්වා ඡේදයන් තෙවන පිටුවට ද ඉතිරිය අනෙක් පිටුවට ද වන ලෙස සකස් කළ යුතු අතර අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව සම්පූර්ණ කළ යුතුය.

*ආ)* අයදුම් පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල / දෙමළ මාධ්‍ය අයදුම්පත්‍ර වල සිංහලට/දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතුය. නියමිත ආදර්ශ ආකෘතියට අදාළ නොවන, නියමිත දිනට විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින

අයදුම්පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත් සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතුවේ.ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති අතර, සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම් පත්‍රය විභාග නිවේදනයේ දැක්වෙන ඉල්ලුම් පත්‍රයට අනුකූලද යන්න පිළිබඳ අයදුම්කරුවන් විසින් විමසා බැලිය යුතු වේ.එසේ නොවුනහොත් ඉල්ලුම්පත ප්‍රතික්ෂේප විය හැකිය.

8.2 මෙම විභාගය 2021 අගෝස්තු මස 15 දින කොළඹ දී පමණක් පවත්වනු ලැබේ.

8.3 නිවේදනයේ සඳහන් සුදුසුකම් සහිත බව දක්වමින් එම නිවේදනයට අනුකූලව සකසා ඇති නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර හෝ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන්ට නියමිත සුදුසුකම් සපුරා ඇතැයි යන පූර්ව නිගමනය මත තරග විභාගයට පෙනී සිටීමට ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ඉඩ දෙනු ලැබේ. තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා *ගැසට්* නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අසත්‍ය තොරතුරු සපයා ඇති බව හෝ අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

8.4 අයදුම්පත් එවිය යුතු ආකාරය :

නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2021 ජුනි මස 30 දින හෝ එදිනට පෙර අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය, දෙවන මහල, කම්කරු මහලේකම් කාර්යාලය, නාරාහේන්පිට, කොළඹ 05 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුවේ. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "**කම්කරු දෙපාර්තමේන්තුවේ ලඝු ලේඛක තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය 2021** " යන්න සඳහන් කළ යුතුය.තැපෑලේ දී අස්ථානගතවන හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් පිළිබඳව වග කියනු නොලැබේ.

8.5 අයදුම්පතේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරීලත් නිළධාරියෙකු, රු. 28,650/= ක් හෝ ඊට වැඩි හෝ මාසික වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයෙකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.

ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම් :

ඉල්ලුම් පත්‍රය පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක අපේක්ෂකත්වය අවලංගු කරනු ඇත. පත්වීම් ලැබීමෙන් පසුව හෝ සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු යටපත් කර ඇති බව අනාවරණය වුවහොත් ඔහු/ඇය රාජ්‍ය සේවයෙන් පහ කිරීමට පිළිවන.

09. *විභාගයට පෙනී සිටීම* :

විභාගය පවත්වන දිනට එනම් 2021 අගෝස්තු මස 15 දිනට සතියකට කලින් ලැබෙන සේ විභාග ප්‍රවේශපත්‍ර ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරනු ඇත. එවැනි විභාග ප්‍රවේශ පත්‍රයක් නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ. විභාගය සඳහා පෙනී සිටින අයදුම්කරුවන් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවා ගත් ප්‍රවේශපත්‍ර ඉදිරිපත් කළ යුතුය.

විභාගය පැවැත්වීමට නියමිත දිනය වන 2021 අගෝස්තු මස 15 දිනට සතියකට පෙර ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම්, ඒ බව ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් වෙත දුරකථන අංක 0112786541 /0112786542 අමතා දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබා ගත් අයදුම්පත්‍රයේ, මුදල් ගෙවූ කුවිතාන්සියේ සහ ලියාපදිංචි කළ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපතක් ද, සමඟ ඔබගේ විමසීම ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත.

10. අපේක්ෂකයන්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.:-

*අ)* පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත
*ආ)* වලංගු විදේශ ගමන් බලපත්‍රය
*ඇ)* වලංගු රියදුරු බලපත්‍රය

11. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවේ.

12. මෙම විභාගය පැවැත්වීම, පත්වීම් ලබා දීම හා අනෙකුත් සියලු කරුණු පිළිබඳ අවසන් තීරණය කම්කරු කොමසාරිස් ජනරාල් සතු වන්නේය.

***සටහන*** : මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පළවී ඇති නිවේදනවල කිසියම් පරස්පර විරෝධී බවක් ඇත්නම් නිවැරදි ලෙස සලකන්නේ සිංහල භාෂාවෙන් පළකර ඇති නිවේදනය බව කරුණාවෙන් සළකන්න.

කම්කරු කොමසාරිස් ජනරාල්

2021 මස වැනි දින
කම්කරු දෙපාර්තමේන්තුව,
නාරාහේන්පිට,
කොළඹ 05.

**ආදර්ශ අයදුම්පත්‍රය**

| |
|---|
| |

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි.)

**කම්කරු දෙපාර්තමේන්තුවේ ලඝු ලේඛක III ශ්‍රේණියේ තනතුර සඳහා**
බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2021

**The Open Competitive Examination for the Recruitment to the Post of Stenographer (Grade III) in the Department of Labour- 2021**

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : ☐
සිංහල - 1
දෙමළ - 2
ඉංග්‍රීසි - 3
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

අයදුම්කරන තනතුර : ලඝුලේඛක - සිංහල ☐
ලඝුලේඛක - ඉංග්‍රීසි ☐

01.

1.1 අයදුම්කරුගේ මුලකුරු සමඟ නම : ..........................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) (උදා : SILVA, A. B. D. P. A)

1.2 සම්පූර්ණ නම : ..........................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.3 සම්පූර්ණ නම : ..........................................................................................
(සිංහලෙන්/දෙමළෙන්)

1.4 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

1.5 ස්ත්‍රී/පුරුෂ භාවය ස්ත්‍රී - 1 ☐
(අදාළ අංකය කොටුව තුළ ලියන්න) පුරුෂ - 0

02.

2.1 ස්ථිර ලිපිනය : ..........................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.2 ස්ථිර ලිපිනය : ..............................................................................................
(සිංහලෙන්/දෙමළෙන්)

2.3 විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :

i. සිංහලෙන්/දෙමළෙන්: ..............................................................................................
ii. ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්: ..............................................................................................

2.4 දුරකථන අංකය : | | | | | | | | | |

03.

3.1 විවාහක/අවිවාහක බව : අවිවාහක - 1 විවාහක -2 (අදාල අංකය කොටුව තුළ ලියන්න) | |

3.2 උපන් දිනය :
වර්ෂය | | | | | මාසය | | | දිනය | | |

3.3 අයදුම්පත් කැඳවන අවසාන දිනට වයස :

අවු. | | | මාස | | | දින | | |

04. අධ්‍යාපන සුදුසුකම්:

4.1 අ.පො.ස. (සා.පෙළ) විභාගය :

i. විභාගයේ වර්ෂය හා මාසය: වර්ෂය: ................. මාස : .................

ii. විභාග අංකය : ..............................

iii. ප්‍රතිඵල:

| විෂයය | සමාර්ථය | විෂයය | සමාර්ථය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

4.2 අ.පො.ස. (උ.පෙළ) විභාගය:
i. විභාගයේ වර්ෂය හා මාසය: වර්ෂය: ................. මාසය: .................

ii. විභාග අංකය : ..............................

iii. ප්‍රතිඵල:

| විෂයය | සාමාර්ථය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

05. වෘත්තීය සුදුසුකම්:

| පාඨමාලාවේ නම | කාල සීමාව | ආයතනය |
|---|---|---|
| | | |

06. පළපුරුද්ද :

| පුහුණුව ලැබූ හෝ සේවය කළ ආයතනයේ නම | කාල සීමාව |
|---|---|
| | |

07. ඔබ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකට දඬුවම් ලැබ තිබේ ද ? ( අදාල කොටුවේ ( √ ) ලකුණ යොදන්න.

| ඔව් | | | නැත | |
|---|---|---|---|---|

එසේ දඬුවම් ලැබ ඇත්නම් ඒ කුමන වරදක් සඳහා කවර අධිකරණයකින් කවර දඬුවමක් ලැබ ඇත් ද යන තොරතුරු සපයන්න.

08. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර

i. විභාග ගාස්තු ගෙවූ කම්කරු කාර්යාලයේ නම: ....................................
ii. කුවිතාන්සි අංකය හා දිනය: අංකය: ...................... දිනය : ..........................
iii. ගෙවූ මුදල: .......................

| ලදු පත නොගැලවෙන සේ මෙහි අලවන්න. |
|---|

09. අයදුම්කරුගේ සහතිකය :

(අ) මෙම ඉල්ලුම් පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි.මෙහි යම් තොරතුරක් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් විය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තවද මෙහි සියලු තොරතුරු නිවැරදිව සම්පූර්ණ කර ඇති බවද ප්‍රකාශ කරමි.

(ආ) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීති රීති වලට අනුකූලව ක්‍රියා කිරීමටත් මෙම කොන්දේසි අනුව මා නුසුදුස්සෙකු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාග යෙන් පසුව හෝ මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන තීරණයන් පිළිගැනීමට මා එකඟ වෙමි.

(ඇ) මවිසින් කරන ලද මෙම ප්‍රකාශනය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් පත්වීම ලැබීමට නුසුදුස්සෙකු වන බවත් පත්වීම ලැබීමෙන් පසු වුවද සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බව ද මම දනිමි.

(ඈ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

දිනය : ...............................................................

අයදුම්කරුගේ අත්සන

10.අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ............................................................................මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ඇය ................................................. වැනි දින මා ඉදිරිපිටදී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

....................................................
අත්සන සහතික කරන නිලධාරියාගේ
අත්සන හා නිල මුද්‍රාව

දිනය : .......................
සහතික කරන නිලධාරියාගේ නම : .......................
තනතුරː .......................
ලිපිනයː .......................

05- 475

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.